FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER





FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2021
පෙබරවාරි(නවම්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

27





සිහගිරි තුරු මතින් ළා
හිරු කිරණ විදා
රන්වන් දඹුල සෑ මළුවම
කරයි උදා
පින්දම් කරන දෙස් දෙස්
දන මලින් පුදා
රන්ගිරි වෙහෙර නමදිති
බැති සිතින් සදා


ඇතුළු පිටු....
- බෞද්ධ දර්ශනය
- චිත්‍ර කතාව
- බුදුරජාණන් වහන්සේගේ සන්නිවේදන ක්‍රම
- සඳ සිසිල
- සුරස අතිරේකය
- බුදු පදවිය ලද මහා වීරයාණෝ


දඹුලු පුරය බබලන රන්වන් වෙහෙරයි
එහි ඇති පෙති පිළිම සැම සිත් තුටු කරවයි
රංගිරි පුවත්පත දම්රස සැමට බෙදයි
ලැබු නව වසරෙ සැමහට සෙත් පැතුවයි


රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

RSL TELEVISION

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




තුන්ලෝකාග්‍ර වූ බුදුරජාණන් වහන්සේ ලෝක සත්වයා වෙත පතලා වූ මහාකරුණාවෙන්, සම්බුද්ධ ශාසනයත් පිහිටුවා වදාළ සේක. එහි පැවැත්ම සඳහා ''විනය නීති'' පැනවීමත්, ශාසනික වශයෙන් දක්ෂතා පෙන්වූ මහරහතන් වහන්සේලාටත් තනතුරු ප්‍රදානය කළසේක.පක්ෂග්‍රාහී නොවී සාධාරණ ලෙස එය සිදුකළ බුදුරජාණන් වහන්සේ ''ඤාති සංග්‍රහ'' වැරදි ලෙස නොපැවැත් වූ සේක.ඤාතිවරයෙකු වූ දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ සංඝයාගේ පාලනය තමන්ට ලබාදෙන ලෙයසි. එය බුදුරජාණ් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක. පාලනය ධර්‍ම විනය දෙකට නියම කළසේක.

මෙවකට වැඩ සිටි භික්ෂූන් වහන්සේලා අතරින් සුදුසුකම් ලබා සිටි සැරියුත් මහරහතන් වහන්සේටත් මුගලන් මහ රහතන් වහන්සේටත් ''අග්‍ර ශ්‍රාවක' (වමත් සව්, දකුණත් සව්) තනතුරු ප්‍රදානය කෙළේ නවම් පෝදිනයේදිය.පළමුවරට භික්ෂූන් වහන්සේලාගේ ''සම්මේලනයක් රජගහනුවර වේළුවනාරාමයේදී'' පැවැත් වූයේද නවම් පෙහෝ දිනකය. භික්ෂු ජීවිතය නිවැරදිව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ඕවාද ප්‍රාතිමෝක්ෂය බුදුරජාණන් වහන්සේ දේශනා කෙළේද නවම් පොහෝ දිනකය.

බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් ජනතාවට ද දෙව් බඹුන්ටද දහම් දෙසා ඔවුන් සුවපත් කොට ''චාපාල චේතියේ දි ආයු සංස්කාරය අත් හැරීමට තීරණය කෙළේද නවම් පොහෝ දිනකය.ආනන්ද තෙරුන් අමතා මේ බව පැවසූ බුදුරජාණන් වහන්සේට කල්පයක් වැජ සිටින ලෙස ආරාධනා නොකෙලේ මෙම අවස්ථාවේ ආනන්ද තෙරුන් වහන්සේ ''මාරාවේෂව'' සිටි නිසා යැයි ධර්‍ම ග්‍රන්ථවල සඳහන් වේ. මේ නිසා බුදුරජාණන් වහන්සේ නවම් පොහෝ දින ආයු සංස්කාරය අත්හල සේක.

ලංකාවාසී,ලෝකවාසී,බෞද්ධ ජනතාව නවම් පොහොය උතුම් පොහොයක් මෙන්ම ප්‍රතිපත්ති පූජාවෙහිද යෙදෙති.එබැවින් නවම් පොහොය ඉතා වටිනා පොහෝ දිනයක් ලෙසට සඳහන් කළ හැකිය.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# පොළොන්නරු රාජ්‍යයේ පූජනීය ස්ථාන



ලක්දිව ආරම්භ රාජධානිය ලෙස පොළොන්නරු රාජ්‍යයේ වෙහෙර විහාර විශාල ඓතිහාසික ග්‍රන්ථවල වෙයි.(දීපවංශය/ථූපවංසමන්තපාසාදිකාව) යන රාජ්‍ය කාලය තුළ රාජධානියේ රජකළ විජයබාහු මහරජතුමා ලද ගොඩනැගිල්ල සැළකෙ'. මෙය අසලම ඉදිකර තිබූ බවට රාජ්‍යත්වයේ උරුමය බෞද්ධ ජනතාවගේ දන්තධාතූන් වහන්සේත් වහන්සේ සුරක්ෂාකොට සඳහා මෙම අලංකාර මන්දිරය ගොඩනැගූ බව තොරතුරුවල සඳහන් වී දන්ත ධාතූන් වහන්සේත් වහන්සේත් විශේෂ මණ්ඩපයක තැන්පත් කර තිබූ බව ඉතිහාසඥයින්ගේ පිළිගැනීමයි. සියලුම ගොඩනැගිල්ල ගවේෂකයින්ගේ වාර්‍තා අනුව පෙනීයන ගල්කණුවලට අලංකාර කැටයම් යොද වහන්සේලා සහ පාත්‍රධාතූන් වහන්සේට ''වේලක්කාර හමුදාවක්'' යොදවා තිබුණු සෙල්ලිපියෙන් තොරතුරු ලබාදෙයි. මෙම (කාලිංග,මාඝ) ආක්‍රමණය බතිරි නටඹුන් හැකිය.පොළොන්නරු වන්දනාවේ යන දැකබලාගත හැකිය.එමෙන්ම වන්දනාමාන උදුවී තිබේ.



වූ දෙවන ප්‍රධාන සැළෙකන නිර්මාණය වූ ප්‍රමාණයක් ගැන කරුණු සඳහන් ශ ය / ක්‍රි.ව.1055 සිට 1110 පොළොන්නරු රජෙකු වූ 1 වන විසින් ගොඩනගන ''අටදාගෙය'' ලෙස රජමාළිගාව සාධක තිබේ. ලෙස සැළකූ මුදුන්මල්කඩ වූ ශ්‍රී පාත්‍ර ධාතූන් තැන්පත් කිරිම දෙමහල් දළදා ඉතිහාසගත තිබේ. පළමු මහලේ පාත්‍ර ධාතූන් භාවිතා කරමින් නිර්මාණයකර ඇති බව කරුණකි. මෙම ශාලාවට යොදා ඇති තිබෙනු දක්නට ලැබේ. දන්තධාතූන් නිරතුරුවම ආරක්ෂාව ලබාදීම සඳහා බවට ගොඩනැගිල්ල අසළ ඇති ගොඩනැගිල්ල විනාශ වි ගියත් වලින් තොරතුරු දැකගත බැතිමතුන්ට මෙම පූජනීය පිංබිම සිදුකර පිං සිදුකර ගැනීමටද අවස්ථාව

විජය තලවත්තේගෙදර



# බුදු සසුන බැබළ වූ නවම් පොහොය

**වර්ෂයක් උදා වී එහි දෙවෙනි පොහොය වශයෙන් එළඹෙන්නේ නවම් පුර පසළොස්වක පොහොයයි. එය පෙබරවාරි මාසය තුළ අපට සිහිකළ හැකි උතුම් පුන් පොහෝ දිනයකි. නවම් පුන් පොහෝ දිනය බෞද්ධයින්ට වැදගත් වන්නේ කුමන සිදුවීම් මුල් කරගෙනද යන්න විමසා බැලීම වැදගත් වේ....**

ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් සිදුවීම් කීපයක්ම සිදුවී ඇති නවම් පුර පසළොස්වක පුන් පොහෝ දිනය ලෝක බෞද්ධ ජනයාට අනුස්මරණීය දිනයකි. එයට හේතුන් ලෙස සැලකෙන්නේ,

1. භික්ෂූන් වහන්සේලා පළමුවරට එක් රැස් කොට මහා සංඝ සම්මේලනයක් පැවැත්වීම.
2. සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාට අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රදානය කිරීම.
3. භික්ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රතිමෝක්ෂය දේශනා කිරිම.
4. බුදුරජාණන් වහන්සේ මෙයින් තෙමසකට පසු පිරිනිවන් පානා බව භික්ෂූන් වහන්සේලාට දැනුම් දීම.

යන කරුණු නවම් පුර පසළොස්වක පුන් පොහෝ දිනය තුළ සිදුවී ඇත. පළමු කාරණය පිළිබඳව අවධානය යොමු කර බැලීමේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ පිරිස ප්‍රධාන වශයෙන් කොටස් 4කට බෙදා දැක්විය හැකිය.

- භික්ෂු
- භික්ෂුනී
- උපාසක
- උපාසිකා ආදි වශයෙනි.

මෙම පිරිස සිව්වනක් පිරිස හෙවත් සිවුවැදෑරුම් ශ්‍රාවක යනුවෙන් හැඳින්විය හැකිය. මෙම චතුරංගනී පිරිසේ නායකත්වය දැරුවේ ශාස්තෘන් වන අපේ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ පාලනය කළේ ධර්ම රාජ්‍යයයි. භික්ෂු, භික්ෂුනී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස මුල් වරට 1250 කට වැඩි නොවුන බව සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ මෙම පිරිස සියල්ලම රජගහ නුවර වේළුවනාරාමයට එක්රැස් කොට මහා සංඝ සම්මේලනයක් පවත්වන ලදී. එය සිදුවූයේ නවම්පුර පසළොස්වක පොහෝ දිනය තුළයි. බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ මෙම භික්ෂු සම්මේලන ක්‍රමය රාජ්‍ය පාලනය තුළටද ආදර්ශයක් වූවාට කිසිඳු සැකයක් නොමැත. රාජාණ්ඩු හා සමූහාණ්ඩු තුළ එම ක්‍රමය දැකගත හැකිය.

සමූහාණ්ඩුවක් වූ ලිච්ඡවි රාජ්‍යය තුළ සමඟියෙන් රැස්ව සමඟියෙන් කටයුතු කොට සමඟියෙන් විසිරයෑමේ දේශපාලනමය න්‍යාය ඉස්මතුවී පැවතුණි.

වර්තමාන පාලන තන්ත්‍ර තුළ ඒ ඒ රටවල් වල පාර්ලිමේන්තු ක්‍රමයද ඊට අනුගතව පවතී. රටේ නායකයා හා මැති ඇමතිවරුන් මසකට වතාවක් දෙවතාවක් එකම තැනකට එකතු වී රටේ ප්‍රශ්න ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා කිරීම හා ඒ සඳහා ගතයුතු පියවර ගැනීම රටක සමාජයක අභිවෘද්ධිය පිණිස හේතු වේ. එම උතුම් පණිවිඩය පළමු වරට අපට කියා දුන්නේ අද වාගේ පොහෝ දිනක අපේ ශාස්තෘවරයාණන් වහන්සේ බව සිහිපත් කළ යුතුව ඇත.

දෙවෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ සුදුස්සාට සුදුසු තැන දීමේ පිළිවෙතයි .

මංගල සූත්‍රය තුළ "පූජාච පූජනීයාං" පිදිය යුත්තන් පිදීමේ උතුම් ගුණාංගයට දෙවෙනි කාරණය තරමක් දුරට සමානය. බුදුරජාණන් වහන්සේ දකුණත් සවු වශයෙන් සැරියුත් මහරහතන් වහන්සේද වමත් සවු වශයෙන් මුගලන් මහරහතන් වහන්සේද පත් කරන ලදී.

එම අග්‍ර ශ්‍රාවක තනතුරු මුහුණ බලා හෝ වෙනත් සම්බන්ධතාවයක් මත පදනම් වූවක් නොවේ. උපරිම සුදුසුකම් අනුවත් සසර කරන ලද ප්‍රාර්ථනා බල මහිමයත් මත බුදුරජාණන් වහන්සේ එම තනතුර මෙසේ පිරිනමන ලදී. ඒ අනුව මුලින් සඳහන් කළ මහා සංඝ සංවිධානයේ ධර්ම සේනාධිපති තනතුරට සැරියුත් රහතන් වහන්සේද ධර්ම පුරෝහිත බවට තන්ත්‍ර තුළ ඒ ඒ රටවල් වල පාර්ලිමේන්තු ක්‍රමයද ඊට අනුගතව පවතී. රටේ නායකයා හා මැති ඇමතිවරුන් මසකට වතාවක් දෙවතාවක් එකම තැනකට

එකතු වී රටේ ප්‍රශ්න ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා කිරීම හා ඒ සඳහා ගතයුතු පියවර ගැනීම රටක සමාජයක අභිවෘද්ධිය පිණිස හේතු වේ. එම උතුම් පණිවිඩය පළමු වරට අපට කියා දුන්නේ අද වාගේ පොහෝ දිනක අපේ ශාස්තෘවරයාණන් වහන්සේ බව සිහිපත් කළ යුතුව ඇත. දෙවෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ සුදුස්සාට සුදුසු තැන දීමේ පිළිවෙතයි .

මංගල සූත්‍රය තුළ "පූජාච පූජනීයාං" පිදිය යුත්තන් පිදීමේ උතුම් ගුණාංගයට දෙවෙනි කාරණය තරමක් දුරට සමානය. බුදුරජාණන් වහන්සේ දකුණත් සවු වශයෙන් සැරියුත් මහරහතන් වහන්සේද වමත් සවු වශයෙන් මුගලන් මහරහතන් වහන්සේද පත් කරන ලදී.

එම අග්‍ර ශ්‍රාවක තනතුරු මුහුණ බලා හෝ වෙනත් සම්බන්ධතාවයක් මත පදනම් වූවක් නොවේ. උපරිම සුදුසුකම් අනුවත් සසර කරන ලද ප්‍රාර්ථනා බල මහිමයත් මත බුදුරජාණන් වහන්සේ එම තනතුර මෙසේ පිරිනමන ලදී. ඒ අනුව මුලින් සඳහන් කළ මහා සංඝ සංවිධානයේ ධර්ම සේනාධිපති තනතුරට සැරියුත් රහතන් වහන්සේද ධර්ම පුරෝහිත බවට මුගලන් රහතන් වහන්සේද පත්වූහ.

මෙම සුදුස්සාට සුදුසු තැන දීමේ බෞද්ධ ප්‍රතිපදාව නොහොත් බෞද්ධ සම්ප්‍රදාය අද සමාජයටද ගතයුතු ආදර්ශයකි. අද බහුතරයක් නොසුදුසුකම් මත තානාන්තර නිලතල හොබවති. මේ ක්‍රමය මත සිදු වන්නේ දක්ෂයාට, සුදුස්සාට අවශ්‍ය තැන අහිමි වීමයි.

ඒ අනුව තම හදවතට අවංකව තමාට ඇති හැකියාවන් හා සුදුසුකම් අනුව තනතුරු ලබා එතුළින් රටට සමාජයට යම් සේවය කිරීමට අධිෂ්ඨාන කර ගන්නේ නම් මෙම පොහෝ දිනයේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ එම බෞද්ධ සම්ප්‍රදාය ආරක්ෂා කළා වන්නේය.

තෙවැනි කරුණ තුළින් බුදුරජාණන් වහන්සේ ධර්ම රාජ්‍යය පවත්වාගෙන යාමට අවශ්‍ය විනය නීති මාලාවක් ඉදිරිපත් කොට ඇත. බුදු සසුනේ මුල් යුගය තුළ එය අවවාදාත්මක ස්වරූපයෙන් පැවතුණි. බුදුරජාණන් වහන්සේ එය පවත්වාගෙන ආවේ,

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානුසාසනං"

යනාදී වශයෙනි.

එනම් සියලු පව් නොකරන්න. කුසල් දහම් රැස් කරන්න. සිත පිරිසිදු කරගන්න. යන ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.

මෙම ක්‍රමය බුදුවී මුල් විසිවසර තුළම පවත්වාගෙන ආ නමුත් ඊට පසු එහි සංශෝධනයක් කරමින් බුදුරජාණන් වහන්සේ විනය ප්‍රාතිමෝක්ෂය දේශනා කළ සේක.

ඒ කෙසේ වෙතත් මුල් කාලයේ භික්ෂු සංස්ථාව තුළ මෙම ඕවාද ප්‍රාතිමෝක්ෂය තුළින් නිසි සංවරයක් ඇති වූ බවක් දක්නට ලැබේ. පසු කාලීන බුදු සසුනට ඇතුළත් වූ ඡබ්බග්ගිය, උදායි, සුදින්න වැනි භික්ෂූන් වහන්සේලාගේ යම් යම් වැරදි ක්‍රියාකාරකම් නිසා විනය නීති ස්ථිර වශයෙන්ම පැනවීමට සිදුවිය. රටක සමාජයක වුවද නීති පද්ධතියක් තිබිය යුතු අතර එය කඩ කරන්නන්ට එරෙහිව දඩුවම් පැනවීමද සිදුවිය යුතුය. අද මොන තරම් නීති රීති තිබුණද එය ආරක්ෂා කිරිම පිළිබඳ ප්‍රශ්නයක් උද්ගතව ඇත. රටක විනය ආරක්ෂා වන්නේ නීති රීති අනුගමනය කිරිම තුළිනි. බුදුරජාණන් වහන්සේ පනවන නීති විනය නීති තුළින් අද දක්වාම සාසනයේ පැවැත්ම සිදුවිය. "විනයො නාම සාසනස්ස ආයු" එය බුදු සසුනේ චිර පැවැත්ම නොහොත් ආයුෂයි.

15 පිටුවට....

අවුලේගම රණවනයාගම/බමුණුගෙදර ශ්‍රී සඳහම් සෙවණ බෞද්ධ මධ්‍යස්ථානාධිපති කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ නියෝජ්‍ය පරිවේනාධිපති
ගලගෙදර රතනවංස හිමි

# බුදුදහමෙහි ඉගැන්වෙන ශාරීරික සුවතාවය



මිනිස් ජීවිතය පිළිබඳ සත්‍යවූත් නිවැරදි වූත් සාධාරණවූත් ඇගැයීමක් ඉදිරිපත් කළ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයාණෝ බුදුරජාණන් වහන්සේය.

"දුල්ලභඤ්ච මනුස්සත්තං" යන පාඨයෙන් පැහැදිලි කර ඇත්තේ මිනිසත් බව ලැබීම දුර්ලභව සිදුවන දෙයක් බවයි. "දුල්ල හො පුරිසුත්තමො" මිනිසත් බව දුර්ලභ ලෙසටද දක්වා තිබේ. උසස් මනසක් ඇත යන අර්ථයෙන් ද, මිනිසා යනුවෙන් අර්ථ විග්‍රහයකින් මෙහි ඉදිරිපත් කර තිබේ. "දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ යනුවෙන් ලෝවැඩ සඟරාවෙහි ද මේ බව දක්වා තිබේ.

මෙම ප්‍රකාශන වලින් පැහැදිලි වන්නේ මිනිස් ජීවිතයක් ලබා ගැනීමේ ඇති වටිනාකම නොවේද, බුදුරජාණන් වහන්සේ මිනිස් ජීවිතයක් සාර්ථක කර ගැනීමට හේතුවන කරුණු පරාභව, මංගල, වසල, ව්‍යග්ගපජ්ජ යන සූත්‍රානුසාරයෙන් ඉදිරිපත් කළ සේක. නිවැරැදි ජීවිතයක් ගත කරන මිනිසාගේ සුවතාවය ගැන වැදගත් වන බව බුදුදහමේ පෙන්වා දී තිබේ.

එක් දිනක් කොසොල් මහ රජතුමා සහල් නැලි දාසයක බත් අනුභව කර ශාරීරික අපහසුතාවයෙන් සිටින අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ එතුමාට දේශනා කළේ "ආරෝග්‍යා පරමා ලාභා" නිරෝගි බව උතුම් ලාභයක් වන බවයි. මෙය පිළිගත් කොසොල් මහ රජතුමා ආහාර අනුභවය ක්‍රමානුකූලව (පිළිවෙලකට) අඩුකර ශාරීරික සුවතාවය ආරක්‍ෂා කරගත්තේය.

ජනතාව ගැවසෙන ස්ථාන වල ජලය ඇති තැන් වලට මල මූත්‍රා නොදමන ලෙසට කරුණු දැක්වූ බුදුරජාණන් වහන්සේ ජලය පෙරා පානය කරන ලෙසට ද උපදෙස් දුන් සේක. පෙරහන් කඩයක් පාවිච්චියට අනුදැන වදාළහ. එය ශාරීරික සුවතාවයට තදින්ම බලපාන බවද පැහැදිලි කර දීමටය.

වනාන්තර විනාශ කිරීමේ ආදීනව පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ එක් තැනක "රමණීයානි අරඤ්ඤානි" යනුවෙන් වනාන්තරයන්ගේ අලංකාරය ඇගැයීමට ලක්කළ සේක. මෙයින් උන්වහන්සේ බලාපොරොත්තු වූයේ මිනිසාගේ පැවැත්ම සඳහා වනාන්තර බලපාන බව පෙන්වා දීමටය. වනාන්තර ඇසුරෙන් ජීවත්වීම තුළින් ශාරීරික සුවතාවයක් ඇතිවෙන බවද, සිතට සැහැල්ලුවක් ගෙනදෙන බවද, විස්තර වෙයි. මිනිසාගේ ජීවිත පැවැත්ම සඳහා පරිසරයෙන් විශාල පිටුවහලක් ඇතිවෙන බවත් එය පිරිසිදුව තබා ගැනීම ඉතා වැදගත් වන බව බුදුදහමෙහි සඳහන් වී තිබේ. කායික හා මානසික සුවය සඳහා අවට වනාන්තරවල (ජන ශූන්‍ය ප්‍රදේශවල) ජීවත්වීම සුවදායක බව පැහැදිලි කරදී ඇති එක් සූත්‍රයක් වශයෙන් කරණීයමෙත්ත සූත්‍රය දැක්විය හැකිය. භික්ෂූන් වහන්සේලාට වනසෙනසුනක් අනුදැන වදාරා ඇත්තේද "භාවනා කිරීමට" උපකාර වන නිසාය.

භික්ෂූන් වහන්සේලා අතර (විනයධර, ධර්මධර) ඇතිවූ අරගල යේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කලේ පිරිස අතරින් වෙන්ව වන සෙනසුනක විවේකීව ගතකිරීමය. එය ගතටත් සිතටත් සැහැල්ලු බවක් ගෙන දෙන්නක් විය. චිත්ත ඒකාග්‍රතාවයටත් ශාරීරික වර්ධනයටත් ව්‍යායාම වෙනුවට භික්ෂූන් වහන්සේට අනුදැන වදාලේ පිණ්ඩපාතයේ යැමත් මළුපෙත්මන් ඇමද පිරිසිදු කිරීමත් සක්මන් භාවනාවේ යෙදීමත්ය. දිනකට වරක් ස්නානය කොට ශරීරය පිරිසිදුව තබා ගැනීමත් අඳින සිවුරු ආදිය පිරිසිදුව තබාගැනීමත් අවශ්‍යම වන බව බුදුදහමෙහි දැක්වේ. ආහාර ගැනීම (උදේ/දහවල්) ප්‍රමාණයට අනුව සිදුකළ යුතු බව (භික්ෂූන් වහන්සේලාට) "සේඛියා " වල සඳහන් වෙයි. රාත්‍රී කාලයේ භික්ෂූන් වහන්සේලාට ආහාර ගැනීම නුසුදුසු බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත්තේ (විකාල භෝජනා වේරමණී ශික්ඛාපදං) භාවනා කිරීමට ඇතිවන බාධාව නිසා විය හැකිය. පොදුවේ ගත්කළ රාත්‍රී කාලයේ ආහාර ගැනීම චිත්ත ඒකාග්‍රතාවයට අහිතකර වන බව මෙම ඉගැන්වීම් වලින් පැහැදිලි වෙයි. වෛද්‍ය වරුන්ගේ මතය වී ඇත්තේ ද රාත්‍රී කාලයේ ඉතා සුළු ආහාරයක් ගැනීමයි. සුප්,කිරි වැනි දියරයක් පාවිච්චි කිරීම සෞඛ්‍යයට හේතු වන්නක් වන බවයි. මැසි මදුරු උවදුරු වලින් බේරීම සඳහා සිවුරු පාවිච්චියට ගතයුතු බව භික්ෂූන් වහන්සේලාට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. භික්ෂුන් වහන්සේලාගේ සෞඛ්‍යය ආරක්‍ෂා කරගැනීම සඳහා "පූති මුත්ත භෙසජ්ජ" නැමැති ඖෂධයක් පාවිච්චි කිරීමට භික්ෂූන් වහන්සේලාට අනුදැන වදාරා තිබේ. කොළ වර්ග යොදා සාදාගත් කැඳ, උදෑසනින්ම පානය කිරීම ඉතා යෝග්‍යබවත් (ගිහි වලද පිණිස) ධර්මයෙහි සඳහන් වෙයි. මෙය ගිහි පැවිදි යන දෙපිරිසටම අදාලව දේශනා කර තිබේ. ආරාමයක වාසය කරන යම් භික්ෂුවකට රෝගයක් වැලඳුනු විට එම භික්ෂුව පිරිස අතරින් වෙන්කර තබා එම රෝගියාට උපස්ථාන කල යුතු බව විනය ග්‍රන්ථවල සඳහන් වෙයි. ආරාමයන්හි ඇති දූවිලි අපද්‍රව්‍ය සතියකට වරක් හෝ ඉවත් කළ යුතු බවත් අවට පරිසරය පිරිසිදුව තබාගත යුතු බවත් විනය ග්‍රන්ථවල සඳහන් වෙයි. වැසිකිලි පාවිච්චි කිරීමෙන් පසු අත්පා මැනවින් සේදීමටත් ජලය ලබාගත් භාජනයේ ජලය ඉවත්කර මුනින් නමා තැබිය යුතු බවත් වැඩිදුරටත් එහි සඳහන් වෙයි. බුදුදහමෙහි දැක්වෙනඉහත සඳහන් කරුණු අතරින් වැඩි ප්‍රමාණයක් ගිහි පැවිදි භේදයකින් තොරව මිනිස් වර්ගයාටම බලපාන කරුණු ලෙස මෙහිලා සඳහන් කිරීමට පුළුවන.

**විජය**

## ධම්ම පද ගීතය

''පණ්ඩිත වග්ගය
81.6 - 83.8
ඇසුරිණි''


### "නැණ පව්ව"


මහා විලක් සේ
ගැඹුරුයි නිමලයි....
කැළඹිල්ලක්.. නෑ....නෑ....
මහා මෙරක් සේ
නිහඬයි නොසැලෙයි
ලතැවිල්ලක්... නෑ..... නෑ...
සැදැහැම් අනුදත් නැණැති දනා.....

සැප සම්පත් ලුහුබැඳ
නෑ.... යන්නේ.....
දුක සැප මැදහත් සේ
ඉවසන්නේ....
ඉසුරු සැපත් පොදි
වැඩි කර ගන්නට
චාටු බසින් නෑ දනා
රවටන්නේ.....

ඇඳුමින් දන සම්පත්
අරගන් නෑ....
ඇඳුමින් පව්කම්වල
නියැලෙන් නෑ...
සිල්වත් ගුණවත්
සුවැඳ හමායන,
මහ පැණසර මිණි පව්වක්
වේ ඔහු....

*පී.එම්. අහංගම*





# බුදුරජාණන් වහන්සේගේ සන්නිවේදන ක්‍රමවේදය

ලොව පහළ වූ ශාස්තෘන් අතරින් විවිධ සන්නිවේදන ක්‍රම භාවිත කරන ලද ශාස්තෘවරයෙකු ලෙස බුදුරජාණන් වහන්සේට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. ප්‍රඥාවේ අග්‍රඵලයත් කරුණාවේ ප්‍රතිමූර්තියත් එක්තැන් කලා වූ සන්නිවේදකයෙකු ලෙස භාරතීය සමාජය තුළ ප්‍රසිද්ධියට පත් වූයේ බුදුරජාණන් වහන්සේමය. විවිධ සිතුම්, පැතුම් හා ගති ලක්‍ෂණ වලින් යුක්ත ජන සමාජයට සත්‍ය අවබෝධය ලබාදීම සඳහා යොදාගත් ක්‍රමවේද රාශියක් ගැන ''නිකාය අට්ට කථාවෙහි'' සඳහන් වේ. එක් එක් පුද්ගලයාගේ මානසික ස්වභාවය තේරුම් ගෙන ඔවුනට උචිත වන පරිදි සන්නිවේදන මාධ්‍යයන් භාවිත කරමින් දහම් දෙසා නිවන් මඟට යොමු කළ බව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වෙයි. භාවිත කරන ලද සන්නිවේදන ක්‍රම කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

I. ආමන්ත්‍රණය කිරීම
II. ප්‍රශ්න ඇසීම
III. මුහුණට මුහුණලා සාකච්ඡා කිරීම
IV. උපමාවන් ඉදිරිපත් කිරීම
V. පෙනෙන දේ ගෙන හැර දැක්වීම
VI. යෝග්‍ය භෞතික වස්තු යොදා ගෙන කරුණු පැහැදිලි කිරීම යනාදියයි.

ඉහත සඳහන් ක්‍රමවේදනයන් අනුගමනය කරමින් උචිත පරිදි ඒවා යොදාගෙන ධර්මය දේශනා කිරීම බුදුරජාණන් වහන්සේ අනුගමනය කරන ලද පිළිවෙල වේ.සැකයට භාජනය වන කරුණු ඉදිරිපත් කිරීම දක්‍ෂ දේශකයෙකුගේ ලක්‍ෂණය නොවේ. අසන්නා තුළ හික්මීම, විනය ඇතිවෙන පරිද්දෙන් කරුණු ඉදිරිපත් කිරීම දක්‍ෂ සන්නිවේදකයකුගේ ලක්‍ෂණයක් වේ. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන අවස්ථාවේදී ඉදිරිපසසිටින ශ්‍රාවක ජනයාට පෙනෙන්නේ තමන්ටම දේශනාව පවත්වන බවයි. ඒ අනුව ධර්ම ශ්‍රාවකයින් වෙනත් අරමුණකට නොයන පරිද්දෙන් එක අරමුණක රඳවා තබාගැනීම දේශකයාගේ දක්‍ෂතාවයයි. එම කරුණ බුදුරජාණන් වහන්සේගේ දේශනා ක්‍රම වේදයන්හි දක්නට ලැබෙන බව සූත්‍රාන්තවල සඳහන් වේ. පියවරින් පියවර කරුණු ඉදිරිපත් කිරීම නිසා බුදුරජාණන් වහන්සේගේ දේශනාවන් ජනතාව අතර ජනප්‍රිය විය.දෙව්රම් වෙහෙර දම්සභා මණ්ඩපයේ බුද්ධ දේශනාව පවත්වන බව දැනගත් ජනතාව යොදුන් ගණන් පා ගමනින් එම ස්ථානයට පැමිණෙන බව බෞද්ධ ග්‍රන්ථවල සඳහන් වෙයි. ධර්ම දේශනාව ට සවන් යොමු කළ ශ්‍රාවකයින් නිසොල්මනේ එකම ඉරියව්වකින් සිටි බවත් දැක්වේ. අන්‍ය ලබ්ධිකයින් ද (බ්‍රාහ්මණයින්) බුදුරජාණන් වහන්සේගේ දහම් දෙසන විලාසයට පැහැදී ශ්‍රාවකයින් බවට පත් වූ අවස්ථාවන්ද ''අගගික භාරද්වාජ'' සූත්‍රයෙන් දැක්විය හැකිය. අගගික භාරද්වාජ බමුණා ප්‍රකාශ කර සිටියේ දේශනාව ඉතා යහපති ''චක්ඛු මන්තා රූපානි දක්ඛින්තීති, එව මෙතං භවං ගොතමො ධමෙමා විකාසිතො'' ඇතැම් අවස්ථාවලදී ධර්ම දේශනාවෙන් දමනය වූ පුද්ගලයින් ශ්‍රාවකයින් බවට පත් වී තිබේ. තුන් බෑ ජටිලයින්ගේ දමනය එබඳු අවස්ථාවකි. නාලාගිරි හස්ථි රාජයා (රා සොළොස් කලයක් පානය කල) දමනය වූයේද බුදුරජාණන් වහන්සේගේ ශාන්ත වූ කරුණා බරිත වචන යෙදූ දේශනාව නිසාය. ආලවක, අංගුලිමාල වැනි දරුණු අය දමනය වූයේද බුදුරජාණන් වහන්සේගේ ස්ථානෝචිත ධර්ම දේශනා විලාසය නිසාය.

බුදුරජාණන් වහන්සේ පළමු කොට ශ්‍රාවකයනට, දානකථාවෙන් දේශනා පැවැත්වූ සේක.ඊළඟට ශීලයෙහි ඇති වටිනාකමත් වදාළ සේක. කාමයන්ගේ ආදීනවත් එයින් වැළකී සිටීමේ අනුසස්ද දක්වා තිබේ. ආශාවන්ගෙන් ඈත් වී ධර්මානුකූල දිවි පෙවත ගතකිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයද පෙන්වා දෙමින් දහම් දෙසූ සේක.

දහම් ඇසීමට පැමිණි පිරිසට ගැළපෙන අයුරින් දහම් දෙසීම, දහම් ඇසීමට පැමිණි පිරිසගේ සිත්හි ඇති කරුණු අනුව දහම් දෙසීම, පිරිස විසින් අසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු ලෙස දහම් දෙසීම, ජනයා අතර පැතුරුණු ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් දහම් දෙසීම (මංගල සූත්‍ර දේශනාව දෙවියන්ගේ පැනයට පිළිතුරු වශයෙන් දේශනා කරන ලද සූත්‍ර ධර්මයකි) කොසොල් රට කේසපුත්ත නියම්ගමට බුදුරජාණන් වහන්සේ වැඩම කළ අවස්ථාවේදී කාලාමයන්ගේ සැකය දුරු කිරීම මූලික කරගෙන දේශනා පැවැත් වූයේ ඔහුගේ පිළිගැනීම් දුරු කරන අදහසිනි. එය බොහෝ දෙනාගේ සතුටට හේතු විය. පළමුව අන් අයගේ අදහස් වලට ගරුකළ බුදුරජාණන් වහන්සේ දෙවනුව එහි ඇති සත්‍ය, අසත්‍යතාවය පෙන්වා දෙමින් දහම් දෙසූ සේක. උපමා මගින් පැහැදිලි කරමින් දහම් දෙසූ අවස්ථාවන් අපට දක්නට ලැබේ. ''කුම්භූපමාව,චූල්ල හත්ථි පදෝපම සූත්‍රය, අලගද්දූපම සූත්‍රය, අන්ධවේනු උපමාව, සල්ලෝපමාව'' නිදසුන් වශයෙන් දැක්වීමට පුළුවන.

නන්ද කුමරුගේ කථා ප්‍රවෘත්තිය කියවන විට පෙනී යන්නේ රූපයේ ඇති ආදීනව උපමාවකින් පෙන්වීමට පිළිස්සුණු වැඳිරියක් ජනපද කල්‍යාණියට සමාන කිරීමක් දෙව් ලොව දෙවගනන් රූපයෙන් යුක්ත බව පෙන්වා ඇය අවවාද කිරීමත්ය. මෙම කරුණු වලින් පෙනී යන්නේ අවස්ථානෝචිත ලෙස ධර්ම කරුණු හැසිරවීමේ ක්‍රමවේද බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ බවයි.

මෙවැනි ධර්ම සන්නිවේදන ක්‍රම මගින් ජනතාවට ධර්ම දේශනා කිරීම නිසා එවකට විශාල පිරිසක් (කුල,ගෝත්‍ර වශයෙන් නොව) බුදුරජාණන් වහන්සේ සරණ ගියහ. මේ නිසා අන්‍ය ආගමිකයින් විවිධ නින්ද, චෝදනා බුදුරජාණන් වහන්සේට ඉදිරිපත් කළහ. ඒ කිසිවකින් කම්පාවට පත් නොවූ බුදුරජාණන් වහන්සේ තම ආගමික සේවාවන් ඒ අයුරින් ම පවත්වාගෙන ගිය සේක. උන්වහන්සේ අනුගමනය කරන ලද සන්නිවේදන ක්‍රම මාර්ගයන් උපයෝගී කරගෙන දහම් දෙසූ අයුරු බුදු දහමෙහි මැනවින් විස්තර කර තිබේ. එය සත්ත්වයින්ගේ දෙලොව යහපත පිණිස හේතු විය.

**-විජය-**

## බෞද්ධයාගේ අත්පොත ලෙස ගෞරවාදරයට පාත්‍ර වූ ධම්මපදයෙන් උපදෙස් ස්වල්පයක්



**"අසාරෙ සාරමතිනො - සාරෙ චාසාර දසසිනො**
**තෙ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡා සංකපප ගොචරා"**

අර්ථය :- අසාර දෙය සරු යැයි පිළිගෙන සරු දැයෙහි අසාරය යන පිළිගැනීම ඇති, වැරදි සංකල්පනාවන් ගොදුරුකොට ඇති, අනුවණ අය, සරු වූ ධර්මයක් නොලබන්නේමය.

**"සාරංච සාරතො ඤත්වා - අසාරංච අසාරතො**
**තෙ සාරං අධිගච්ඡන්ති - "**

අර්ථය :- සාරදැය සාරදැය වශයෙන් ද අසාර දැය අසාර දැය වශයෙන්, දැන නිවැරදි කල්පනාවන් ගෝචර කොට ඇති, ඒ නුවණැති අය සරු දහමක් ලබන්නේමය.

**"සබ්බපාපසස අකරණං - කුසලසස උපසම්පදා**
**සචිත්ත පරියොදපනං - එතං බුද්ධානසාසනං"**

අර්ථය :- සියලු පව් නොකිරීමද කුසල් සිත් ඉපදවීමද තම සිත පිරිසිදු කිරීමද මෙය බුදුරජාණන්ගේ අනුශාසනාවයි.

**"පුණ්ඩරීකං යථා වග්ගු - තොයෙන නුපලිප්පති**
**නුපලිත්තොමිහි ලොකෙන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ"**

අර්ථය :- බුදුරජාණන් වහන්සේ ගත කළ පද්මාකාර ජීවිතයයි. ජලයෙහි ඉපිද ජලයෙහිම වැඩී ජලයෙන් ඉහළට මතු වී ජලයෙහි නොගෑවී සිටිනා රන් නෙළුම් මලක් හෝ සුදු මලක් පරිද්දෙන් කෙළෙස් ගහන මිනිසුන් අතර ඉපිද ඔවුන් අතරෙහිම වැඩී කෙළෙසුන්ගෙන් තොරව ඉස්මතුවී නොගැටී වැඩ සිටි නිසාම උන්වහන්සේ ''බුද්ධ'' නම් වෙති.

**අජන්තා දිසානායක**



# සැමට සරිලන බෞද්ධ දර්ශනය

ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයේ භාරතය ගැන සලකා බැලීමේදී එය "දිට්ඨි ගහනං දිට්ඨි කාන්තාරං" දර්ශන වලින් ගහණ වූ දර්ශන කාන්තාරයක් ලෙස හැඳින්විය හැකිය. බ්‍රහ්මජාල සූත්‍රයේ මිසදිටු ආගම් 02ක් ගැන සඳහන් වේ. මෙම සෑම ආගමක්ම දර්ශනයක්ම අභිබවනය කරමින් ඉතා කෙටි කාලයක් තුළදී බෞද්ධ දර්ශනය භාරතීය සමාජයේ මුල්බැස ගන්නා ආකාරය දක්නට ලැබේ.

සමකාලීන අනෙක් ආගම්වලින් වෙනස් වූ දර්ශනයකි. බෞද්ධ දර්ශනය දර්ශනයේ ශ්‍රේෂ්ඨත්වය පමණක් නොව එම නවතම දර්ශනය ඉදිරිපත් කළ බුදුපියාණන් වහන්සේ සතුව පැවති දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් සමන්විත වූ මහා පෞරුෂයක් උන්වහන්සේ සතුව පැවතිනි. මහා කරුණාව වැනි උතුම් වූ මානුෂීය ගුණාංගත් භාරතීය සිත් ඇදගැනීමත් දර්ශනය ව්‍යාප්ත වීමට හේතු වූ සාධකයන්ය.

බුද්ධකාලීන භාරතයේ පැවති බොහෝ ආගම් නිර්මාණවාදය මත පදනම් වූ ආගම්ය. එදා භාරතයේ පැවති ප්‍රබලම ආගමක් වූ බ්‍රාහ්මණ ආගමේ පදනම නිර්මාණවාදයයි. ලෝකය මැවීමත් මිනිසා මැවීමත් සමාජ ක්‍රමය මැවීමත් යන සියල්ලම මහා බ්‍රහ්මයා අතින් සිදුවූ බව එහි සඳහන් කර ඇත. ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ එන 90 වැනි පුරුෂ සූත්‍රයෙන් හෙළි වන ආකාරයට,

*බ්‍රාහ්මණෝඝ මුඛවාසීත්*
*බාහු රාජන්‍ය කෘතඃ*
*ඌරු තදස්ස යද් වෛශ්‍යඃ*
*පද්භ්‍යාම් ශූද්‍රෝ ආජායත*

මහා බ්‍රහ්මයාගේ මුවින් බ්‍රාහ්මණ මණ්ඩලයද දෙබාහුවෙන් ක්ෂත්‍රිය මණ්ඩලයද කලවා වලින් වෛශ්‍ය මණ්ඩලයද පා වලින් ශුද්‍ර මණ්ඩලයද උපන් වූ බව පෙන්වා දී ඇත. සියල්ලම මහා බ්‍රහ්මයාගේ තීරණය මත සිදුවන බව පවසා උතුම් මිනිසා අකර්මණ්‍ය අචේතනික වස්තුවක් බවට පත්කර ඇති ආකාරය දක්නට ලැබේ.

නමුත් මිනිසාට පමණක් නොව තිරිසන්ගත සත්වයාට පවා එක හා සමානව සැලකූ බෞද්ධ දර්ශනයේ (සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්තා) කේන්ද්‍රය වන්නේ මිනිසාය. මිනිසාගේ සිතය. එහි නිර්මාණවාදයට ඉඩක් නැත.

කවදාවත් නොදුටු මහා බ්‍රහ්මයෙකු ගැන විශ්වාස කිරීම, නොදුටු අයෙකුට ආදරය කිරීම නුසුදුසුයැයි බුදුන් වහන්සේ දේශනා කර ඇත. උන්වහන්සේ එක් අවස්ථාවක දේශනා කළේ "බ්‍රහ්මාති භික්ඛවේ මාතා පිතු රෙතං අධිවචනං" යනුවෙනි.

එයින් පැහැදිළි වන්නේ බෞද්ධ දර්ශනයේ බ්‍රහ්ම යනුවෙන් හඳුන්වාදී ඇත්තේ උතුම් පුද්ගලයින් බවයි. මෙසේ බෞද්ධ දර්ශනය නිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන අතර එය හේතුඵලවාදීය. එයින් පෙන්වන්නේ යහපත් ක්‍රියාවන්ට යහපත් ප්‍රතිඵල ලැබෙන බවත් අයහපත් ක්‍රියාවන්ට (පාපී ක්‍රියා) අයහපත් ප්‍රතිඵල ලැබෙන බවත්ය.

"යාදිසං වපතේ බීජං තාදිසං හරතෙ ඵලං" (යම්සේ බීජ වැපුරුවේද එයට අනුව ඵල ලැබෙන්නේය)

මේ මගින් මිනිසා අකර්මන්‍ය කිරීම වළක්වා ඇත. ඔහුට උත්සාහයෙන් කටයුතු කිරීමට ඉඩ සලසා ඇත. ලෝකයේ පහළ වූ විවිධ ආගම් අතර මිනිස් වර්ගයාගේ ස්වභාවය ඔහුගේ සිතේ ස්වභාවය මතට සිදුවන බව බෞද්ධ දහම අවධාරණය කරයි.

පිරිසිදුකම හෝ අපිරිසිදුකම විමුක්තිය හෝ භෞතික හා ආධ්‍යාත්මික බැඳීම මිනිස් සිත හා සම්බන්ධ බවත් මිනිසාගේ මැවුම්කරු මිනිසාම බවත් (මිනිසාගේ සිත බවත්) මූලික බුදුසමය මනාකොට පැහැදිළි කරයි. මිනිස් සිතේ ස්වභාවය පිළිබඳව කළ දේශනා දර්ශනය පුරාම දක්නට ලැබේ.

*මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ඨා මනෝමයා*
*මනසා චේ පදුට්ඨේන භාසතිවා කරෝතිවා*
*තතෝනං දුක්ඛ මන්වේති චක්කංව වහතෝ පදං"*
(ධම්ම පදය 1 සහ 2)

*පභස්සරමිදං භික්ඛවේ චිත්තෙං තංච ඛෝ ආගන්තුකේහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"*
(අංගුත්තර නිකාය 12)

*චේතනාහං භික්ඛවේ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරෝති කායෙන වාචා මනසා"*
(අංගුත්තර නිකාය 1.103)

මුළු ලෝකයම සිතමත පිහිටා ඇති ආකාරය, චිත්තේන නියති ලෝකෝ' යන පාඨයෙන් හෙළිවේ. බෞද්ධ දර්ශනය මෙන් සිත පිළිබඳව විග්‍රහ කළ වෙන කිසිදු ආගමක් නැත. ඉහත මා විසින් සඳහන් කළ බුද්ධාගම හා සමකාලීන අනෙක් සියල්ලම පාහේ අන්ත 02ක එල්බගත් ඒවාය.

එනම්,

- කාමසුඛල්ලිකානුයෝගය
- අත්තකිලමතානුයෝගය

යන අන්ත දෙකයි. මෙහිදී පළමුවැන්න නම් සැපෙහි ඇලී ගැලී වීසීමත් දෙවැන්න ශරීරයට අපමණ දුක්දීමත් අර්ථවත් වෙයි. බුදුපියාණන් වහන්සේ සිය ප්‍රථම ධර්මදේශනාවෙන්ම අවධාරණය කළ සේක.

*"ද්වේ මෙ භික්ඛවේ අන්තා පබ්බජිතේන න සේවිතබ්බා යෝ චායං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ, හීනෝ ගම්මෝ පොථුජ්ජනිකෝ අනරියෝ. අනත්ථසංහිතෝ, යෝ චායං අත්තකිලමතානු යෝගෝ දුක්ඛෝ අනරියෝ, අනත්ථසංහිතෝ. ඒතේ තේ භික්ඛවේ උභෝ අන්තේ අනුපගම්ම මජ්ජේමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා. චක්ඛුකරණී, ඤාණකරණී, උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය, නිබ්බාණය සංවත්තති"*
යන්නයි.

එනම්, මහණෙනි, පැවිද්දහු විසින් සේවනය නොකටයුතු අන්ත හෙවත් කෙළවරවල් දෙකක් ඇත. ඒ දෙක නම්, හීනවූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන් විසින් සේවනය කරනු ලබන්නා වූ අනාර්ය වූ අනර්ථ සන්නිශ්‍රිත වූ කාමසුඛල්ලිකානු යෝගයද දුක්වූ අනාර්ය වූ අනර්ථසන්නිශ්‍රිත වූ අත්තකිලමතානුයෝගයද යන මේ දෙකයි.

මහණෙනි, මේ ඉහත කී අන්ත දෙක හැර දමා නුවණැස පිරිසිදු කරන ඥානය පහළ කරන කෙලෙස් දුරුකරනු පිණිස පවතින නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස පවතින මධ්‍යම ප්‍රතිපදාව තථාගත වූ මා විසින් අවබෝධ කරන ලදී." යන්න ධම්මචක්කපවත්තන සූත්‍රාන්ත දේශනාවෙහිදී දේශනා කර ඇත.

සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බවත් අනිත්‍ය දේ නිත්‍ය ලෙස ගැනීමෙන් දුක ඇතිවන බවත් එනම් අනිත්‍ය තුළ ඇත්තේ දුක බවත් (යද නිච්චං තං දුක්ඛං( ආත්මීය වශයෙන් ග්‍රහණය කර ගැනීමට කිසිවක් නොමැති බවත් බෞද්ධ දර්ශනයේදී අවධාරණය වේ.

මුළු ලෝකයම දුක මත පිහිටා ඇත. "දුක්ඛෝ ලෝකෝ පතිට්ඨිතෝ" මෙම සචේතනික අචේතනික ලෝකධාතුවේ අනිත්‍ය ස්වභාවයන් එහිදී හටගන්නා දුකක් පිළිබඳව නිතරම දේශනාකොට ඇත.

*"ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛං අරියසච්චං, ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛෝ, මරණම්පි දුක්ඛං, අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ, පියේහි විප්පයෝගෝ දුක්ඛෝ, යදම්පිච්චං න ලබති තම්පි දුක්ඛං, සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"*

චතුරාර්‍ය සත්‍ය තුළ දුක, දුකට හේතුව හා දුක නැති කරන මාර්ගය ගැන සඳහන් වේ. මෙම දුකට හේතුව තෘෂ්ණාවයි. (තවත් විටක අවිද්‍යාවද දුකට හේතුවක් ලෙස පෙන්වා දී ඇත) තෘෂ්ණාව, කාම තෘෂ්ණාව, භව තෘෂ්ණාව හා විභව තෘෂ්ණාව ලෙස තුන්වැදෑරුම්ය. මෙම තෘෂ්ණාව නැතිකිරීමෙන් දුක නැතිකළ හැකිය.

"තණ්හක්ඛයෝ සබ්බං දුක්ඛං ජිනාති" දුක, දුකට හේතුව, දුක නැති කිරීමේ මාර්ගය වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එමගින් නිර්වාණය ලබාගත හැකිය. පරම සුඛය වන්නේ නිර්වාණයයි. "නිබ්බානං පරමං සුඛං" එහිදී නැවත ඉපදීමක් නැත. එය ශාන්තය. යමක් ශාන්තද එය ප්‍රණීතය. "යන්තං සන්තං ඒතං පණීතං" යනු බුද්ධ දේශනාවයි. එය අවබෝධය පිණිසය.

ශාස්ත්‍රපති රුවන් ජයවීර



# “නිවණ” ඇත්තේ ඔබ ළඟමයි

''නිවණ'' පිළිබඳ බුදු දහමෙහි සඳහන් වන්නේ ''තණහක්ඛයො නිබ්බාණං'' තෘෂ්ණාව සම්පූර්ණයෙන් නැති කළ තැන නිවණ ඇති බවයි. එසේ නම් තෘෂ්ණාව උපදින්නේ කොතැනද? මිනිස් සිතක මිස අන්තැනක නොවේ. මිනිස් සිතේ උපදින රාග, ද්වේශ, මෝහ, වැනි ප්‍රබල කෙළෙස් මුලිනුපුටා දැමිය යුතුවේ.

නිවන් අවබෝධය ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තා ධර්මය දේශනා කරන තැන්වලට ගමන් කරයි. ධර්මයට සිත යොමු කරයි. ධර්මය අසා එය සිතට ගෙන ඒ අනුව තම ජීවිතය ගත කරයි. සිත භාවනාවට යොමු කරයි. නිවන් පසක් කරගන්නා එක් ක්‍රියා මාර්ගයත් එය වේ. ලෝකයේ පවතින යථාර්ථය එලෙසින්ම දැක ගැනීම තවත් එක් පියවරක් ලෙස සැලකිය හැකිය. ශ්‍රද්ධාව මූලික කරගෙන ක්‍රියා කරන පුද්ගලයා සත්‍යාවබෝධයෙන් ප්‍රඥාව පදනම් කරගෙන එය දියුණු කර ගැනීමටත් හැකිවන බව දහමෙහි සඳහන් වේ.

ශ්‍රද්ධාව කොටස් දෙකකට අයත් වේ. අමූලික ශ්‍රද්ධාව හෙවත් පදනමක් නැති ශ්‍රද්ධාව එකකි. මෙම ශ්‍රද්ධාව ප්‍රයෝජනයක් නැත. හේතුව වෙනස් වන්නා වූ ශ්‍රද්ධාවක් වන බැවිනි. ආකාරවතී සද්ධා යනු බුද්ධිමය ශ්‍රද්ධාවයි. කරුණු විමසා බලා ලබාගන්නා වූ සැදැහැවත් බවයි. මෙම ශ්‍රද්ධාව බුදුදහමෙහි ඇගයීමට ලක්කර ඇත.

''චුල්ල හත්ථි පදෝපම'' සූත්‍රයෙන් දක්වා ඇත්තේ වඩාත් සමීපවන හේතු සාධක පමණක් සලකා බලා තෙරුවන් ගැන නිගමනයකට නොඑළඹිය යුතු බවයි. ඒ සඳහා දුර දක්නා නුවණ අවශ්‍ය වේ. ඉන්ද්‍රිය සංවරයෙන්ද සිහිනුවණින්ද යුක්තව යම් සෙනසුනක භාවනා කරන ශ්‍රාවකයා නීවරණයන් දුරුකොට පළමුවන ධ්‍යාන උපදවා ගනී. චතුර්විධ ධ්‍යාන අතරින් එකකින් හෝ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ යැයි ද ධර්මය ස්වාක්ඛාතයි. සංඝයා වහන්සේ සුපටිපණ්ණ යැයි නිගමනය කළ නොහැකිය. අවසානයේ දී ශ්‍රාවකයා සියලු කෙලෙස් නැතිකර උපදවාගන්නා ආසවක්ඛයා ඥානය උපදවා ගනී.

චතුරාර්ය සත්‍යය ඇති කරගනී. සිතට ඇතිවන රාගය, ද්වේශය, මෝහය යන ප්‍රබල අකුසල මූලයන් පාලනය කරගැනීම සඳහා ශ්‍රද්ධාව පෙර දැරි කරගත් චිත්ත සමාධිය අත්‍යවශය වේ. සමථ භාවනාව මගින් ආධ්‍යාත්මික දියුණුව ලබාගෙන සසර දුකට මුල්වෙන රාගාදී කෙළෙස් මූලයන් නැති කර විපසසනා භාවනාව වැඩිය යුතුවේ. ඇත්ත ඇති සැටියෙන් දැකීම විපසසනා භාවනාවයි. ''විසේසේන පසසතීති විපසසනා'' නිවැරදි ලෙස විශේෂයෙන් බැලීම මෙයින් අදහස් කරයි. ''ප්‍රඥා භාවනාව'' නමින්ද මෙම භාවනාව හැඳින්වේ. රූපය අනිත්‍ය වේ. සදාකාලික නොවේ. බිඳෙන සුළුය.

නැසෙන සුළුය. රූපය අනිත්‍ය බැවින් දුක් සහගත වේ. දිගු කලක් පුරුදු පුහුණු කිරීමෙන් ස්කන්ධක ධර්මයන්ගේ යථාර්ථය වන ත්‍රි ලක්ෂණය අවබෝධ කරගත හැකි වන්නේය. සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව යම් දිනක අවබෝධවේද එය නිවනට මඟ වන්නේය යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ.(එසමගෙගා

විශුදධියා) ''යථාභූත ඤාණ දසසනය'' නම් පරම සත්‍යාවබෝධය ලැබෙන්නේ මෙම විදර්ශනා භාවනාව මගින්ය.

නිවන් මඟට යොමුවන පුද්ගලයාගේ ලක්ෂණ පෙර සඳහන් කළ අයුරු වේ. මෙම අවස්ථාවන් එක්වරම ලබාගත නොහැකිය.(ථොක ථොකං ඛණෙ ඛණෙ) ටිකෙන් ටික තෘෂ්ණාව නැතිකළ යුතුය. ප්‍රසිද්ධියට යම් යම් දේ පරිත්‍යාගය තුළින් තෘෂ්ණාව නිමවේ යැයි සිතීම අඥානකමකි.

පරිත්‍යාග චේතනාව සත්‍ය වශයෙන් ම තෘෂ්ණාව නැතිකර ගැනීමේ පිවිතුරු සිතකින්ම සිදුකළ යුතුවේ. වෙස්සන්තර ජාතකයේ සඳහන් වන පරිදි උසස්ම පරිත්‍යාගයක් විය යුතුය. සසර දිගු කලක් පුරුදු පුහුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් මේ අත් බැව්හි දී තෘෂ්ණාව ක්ෂය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පරිත්‍යාගයක් සිදුකළ හැකිය. මිනිස් සිත විවිධාකාර වේ. වෙනස් වන සුළුවේ. එබඳු හිතක් ඇති පුහුදුන් මිනිසාට තෘෂ්ණාව නැති කිරීම ඉතා අසීරු කරුණකි. එබැවින් එම කාර්‍යය තම තමන් විසින්ම ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැගිය යුතුය.

''තුමෙහි කිච්චං ආතපපං අක්ඛාතාරෝ තථාගතං'' බුදුරජාණන් වහන්සේලා ගමන් කළ යුතු මඟ පෙන්වා දෙන්නේය. ඒ අනුව ගමන් කිරීම තම තමන්ගේ කාර්‍යය වනු ඇත. ''නිවණ'' යනු තමන් විසින්ම අවබෝධ කරගත යුතු අවස්ථාවකි. එය සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය සිදු වන්නේ තමාගේ ක්‍රියාවන්ට අනුකූලවයි. මෙය පිරිසිදු මනසින් අවබෝධ කරගත යුතු වන්නේය.

ඒ.එස්.දිසානායක

## රුවන් වැකි......



1.පෙරලෙන ගලේ පාසි නොබැඳේ

2.දිලිසෙන සියල්ල රත්රන් නොවේ

3.සතුට උතුම් ධනයයි

4.මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි

5.නිවණ උතුම් සැපතයි

6.අවවාදයට වඩා ආදර්ශය උතුම් වේ

7.දැහැමි දිවිපෙවෙත අනගි වේ

8.අසරණයන්ට පිහිට වෙමු

9.සිල් සුවඳ උඩුසුළඟේ හමායයි

10.අටලෝ දහමට අනුව ජීවත්වන්න

-විජය-

# අකුසල් දුරලීම



පළමු, දෙවන, තුන්වන, හතරවන ආදී ධ්‍යාන වලින් යුත් එනම් අධි චිත්තයෙන් යුත් පුද්ගලයන්ට රාග, දෝස, මෝහ අරමුණක් තම සිතට පැමිණුන විට ඒවා ඉවත් කරගෙන සිත පිරිසිදු කරගන්නා ආකාරය, මජ්ඣිම නිකායේ එන විතක්ක සණ්ඨාන සූත්‍රය (බු.ජ.ම.නි.1 - පි.අ.300) තුළින් භාග්‍යවතුන් වහන්සේ දේශනා කර ඇත.

යෝගාවචර ජීවිතයන් ගතකරන බොහෝ දෙනාට භාවනාවේදී එන ප්‍රධාන ගැටලුවක් වන්නේ තම සිතට විවිධ අකුසල විතක්ක පැමිණ තමන්ගේ චිත්ත ඒකාග්‍රතාවය හෙවත් සමාධිය කැඩී බිඳී යාමයි. අධි චිත්තයෙන් හෙවත් අෂ්ට සමාපත්තීන්ගෙන් යුත් අයට පමණක් මෙම සූත්‍රය දේශනා කර ඇත්තේ සාමාන්‍ය ජීවිතයේ සිටින අය අකුසලයන් අකුසලයන් බව නොදන්නා නිසාය. අකුසලයන් අකුසලයන් බව දැනගැනීමට සිතේ එකඟතාවයක් හෙවත් සමාධියක් අවශ්‍යය. මඩවලක සිටින අයෙකුට මඩ ගැවුනාට නොදැනෙන්නා සේ සාමාන්‍ය සිතක අකුසලයන් ම ඇති බැවින් ඒවා තේරුම් ගැනීමට නොහැක. කෙසේ වෙතත් අකුසලයන්ගෙන් සිත මුදවාගෙන සිත පිරිසිදු කරගැනිමට ක්‍රම පහක් මෙහි දේශනා කර ඇත.

**අඤ්ඤ නිමිත්ත පබ්බං - අකුසල් අරමුණට එරෙහිව වෙනත් කුසල් අරමුණක සිත පිහිටවීම.**

යම් අවස්ථාවක දී රාග, දෝස හෝ මෝහ සිතක් උපන් විට ඊට එරෙහිව වෙනත් කුසල් අරමුණක් මෙනෙහි කිරීම කළ යුතුය.

හරියට ලෑල්ලකට ගසා ඇති විශාල ඇණයකට හාත්පසින්ම ඊට වඩා කුඩා ඇණයකින් පහර දී පසුව අතින් ගලවා දමන්නාක් සේ විශාල වූ අකුසල් අරමුණ කුඩා කුසල් අරමුණක් මෙනෙහි කර සිතෙන් ඉවත් කළ යුතුය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**ආදීනව පසබං - අකුසල් අරමුණේ ආදීනව මෙනෙහි කිරීම.**

ඒ ඒ අකුසල විතක්කයන්ගේ දෝෂය පිරික්සමින් එනම් එහි ආදීනව දකිමින් එම අකුසලය ඉවත් කළ යුතුය. මෙම අරමුණු අකුසල් අරමුණුය, සාවද්‍යය, දුක් විපාක ඇත, යනාදී වශයෙන් සිහිපත් කරමින් ඉවත් කළ යුතුය. කණ්නාඩිය ලඟට ගොස් සැරසෙන තරුණයෙකුගේ හෝ තරුණියෙකුගේ කර මත බලුකුණක් හෝ සර්ප කුණක් හෝ මිනිස් කුණක් දැමුවොත් එය පිළිකුල් කර ඉවත් කරන්නේ යම්සේද, ඒ ආකාරයෙන් අකුසල් අරමුණ ලැජ්ජා සහිතව පිළිකුල් සහිතව ඉවත් කළ යුතුය.

යම් රාග (ලෝභ), ද්වේෂ, මෝහ අරමුණක් සිතේ ඇති වූ විට මෙය නැවත නැවත මෙනෙහි කිරීමෙන් එය වචන බවට පෙරලෙන බවත් පසුව එම අරමුණු කායිකව සිදුකරමින් බොහෝ අකුසල් රැස් කරගන්නා බව නුවණින් මෙනෙහි කළ යුතුය.

මෙලොව වශයෙන් අලාභ, නින්දා, කායික දුක්, මානසික පීඩා, රජයේ වධ බන්ධන වලට ලක්වීමත් ආධ්‍යාත්මික වශයෙන් තමන්ගේ සීලය පිරිහීම, සමාධිය පිරිහීම, ප්‍රඥාව පිරිහීම තුළින් නිර්වාණය දුරස්වීම යනාදියත්, පරලොව වශයෙන් සතර අපාය ආදී දුක් වලට පැමිණෙන බවත්, නුවණින් මෙනෙහි කරමින් අකුසලය සිතෙන් ඉවත් කළ යුතුය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**අසති පසබං - අකුසල් අරමුණ මෙනෙහි නොකිරීම.**

අකුසල අරමුණක් සිතට පැමිණි අවස්ථාවක දී එය මෙනෙහි නොකිරීමෙන් එම අරමුණ ඉවත් කළ යුතුය. රූප දැකීමට අකැමැති ඇස් ඇති පුරුෂයෙක් රූපයක් දුටුවිට ඇස් පියා ගන්නා සේ හෝ වෙනත් යමක් දෙස බලන්නා සේ සිතට පැමිණි රාග, ද්වේෂ, මෝහ , අරමුණු සිහි නොකිරීමෙන් ඉවත් කළ යුතුය.

තමන්ගේ සිතට අකුසල අරමුණක් පැමිණි විට ඒ සමඟම ඊට එරෙහිව "මෙය සිතන්න එපා" යනාදී විධානය නැවත නැවත සිතට ඒත්තු ගැන්වීමෙන් එම අකුසල් අරමුණ මෙනෙහි නොකර ඉවත් කළ හැකිය. මෙසේ දිගින් දිගටම පුහුණු කිරීමෙන් එම අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**විතක්ක මූලභේද පසබං - අකුසලයේ මූලය සිහි කිරීම**

පැමිණි රාග, දෝස, මෝහ විතක්කයේ මූලය සොයා එම මූල ඉවත් කිරීමෙන් අකුසලය ඉවත් කළ යුතුය. යම් අයෙක් වේගයෙන් දුවන විට ඔහු "ඇයි මේ දුවන්නේ ? මෙතන දුවන්න තරම් කරුණක් නැනේ" යන බව අවබෝධ වූ විට ඔහු දුවන ක්‍රියාව නවතා ඇවිදින්නට පටන්ගනී. එසේ ඇවිදින විටත් "ඇයි මේ ඇවිදින්නේ ? මෙතන ඇවිදින්න තරම් කරුණක් නැනේ" මේ බව ඔහුට අවබෝධ වූ විට ඔහු සිටින්නට සිතයි. සිටගෙන සිටින විට, එසේ ඉන්න අවශ්‍ය නැති බව තේරුම් ගත්විට ඉඳගන්න කටයුතු කරයි. ඔහු ඉඳගෙන සිටින විට "ඇයි මේ ඉඳගෙන ඉන්නේ ? මෙතක ඉඳගන්න කාරණයක් නැනේ" යන බව අවබෝධ වූ විට ඔහු ඇලවෙයි. මේ ආකාරයෙන් අකුසල මූලය හොඳින් පිරික්සමින් කටයුතු කරයි නම්, එම අකුසලයේ බලය ක්‍රම ක්‍රමයෙන් අඩුවී අකුසලය ඉවත් වේ.

තමන් වාහනයක් මිලදී ගැනීමට ලෝභ සහගත ලෙස වංචාවෙන්, කපටිකමින් මුදල් ඉපයීම් කිරීම සම්බන්ධයෙන් අකුසල් සිත් පරම්පරාවක් පැමිණුන විට එම විතක්කය පැමිණෙනුයේ වෙනත් අය පාවිච්චි කරන වාහන දෙස බලා තමන්ටත් මෙවැනි එකක් තිබුණා නම් හොඳයි යන මූලික අරමුණ පැමිණුන නිසා බව අවබෝධ කරගෙන ඇත්තටම අවශ්‍යතාවය කුමක්ද? යන්න ක්‍රමයෙන් විශ්ලේෂණය කර එම අකුසල් අරමුණ ඉවත් කළ හැකිය. ගසක අතු ඉවත් කර, කඳ ඉවත් කර, මුදුන් මුල ඇතුලුව සියලුම මුල් ඉවත් කර එම ගස නැවත හට නොගන්නට කටයුතු කරන්නේ යම් ආකාරයකට ද, ඒ ලෙසම අකුසල් විතක්කය ඉවත් කළ යුතු වේ. එසේ කිරීමෙන් තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**අභිනිග්ගණ්හත පසබං - ප්‍රභල කුසල් අරමුණකින් අකුසල් අරමුණ තලා පෙලා දැමීම.**

යම් ලෝභ, දෝස, මෝහ අකසල් අරමුණක් සිතට පැමිණි විට එය දැඩි කුසල් අරමුණක් ගෙන තලා පෙලා දමා එම අකුෂල් අරමුණ පහ කළ යුතුය. ශක්තිමත් පුරුෂයෙක් තම ශක්තිය යොදාගෙන හීන පුරුෂයෙක් මෙල්ල කරන්නේ යම් සේද, ඒ ආකාරයෙන් අකුසල් අරමුණ තලා පෙලා ඉවත් කළ යුතුය.

රාග සිත් පැමිණි විට අසුභය ද, ද්වේශය පැමිණි විට මෛත්‍රිය ද, ථීන මිද්ධය පැමිණි විට ආලෝකය සහ වීර්යය ද, යනාදී වශයෙන් භාවනා කිරීමෙන් අකුසල් සිත් ඉවත් කළ හැකිය. තවද සතිපට්ඨානය තුළ ඇති මෙවැනි විදර්ශනා භාවනා කමටහන් යොදාගනිමින් අකුෂල් සිත් තලා පෙලා දමා බවත් කළ හැකිය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

අධි චිත්තයෙන් යුත් අයෙක් මෙම ආකර පහෙන් අකුසලයෙන් සිත පිරිසිදු කරගෙන එය වශීභාවයට පත් කරගන්නේ නම් ඔහුට කැමති නම් අරමුණ සිතීමටත් අකමැති නම් අරමුණ නොසිතා සිටීමටත් හැකියාව ඇතිවේ. එසේ කරන විට ඔහුගේ තණ්හාව පහ වේ. සංයෝජන ඉවත් වේ. මැනවින් මානය දුරුකොට සංසාර දුක කෙලවර කරගෙන නිවනින් සැනසේ. එසේ අකුසලයන් ඉවත් කරමින් සංසාර දුක නැති කිරීමට සියල්ලන්ටම ශක්තිය ලැබේවා.

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## නිදහස් සිතුවිලි සිතනා සිතත් උදාරයි

සෑම වසරකම පෙබරවාරි මාසය එළඹෙන්නේ ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදීන්ගෙන් යටත් වීමේ උදාර සිතුවිල්ලද අප වෙත ගෙනඑමිණි. 1815 දී ශ්‍රී ලංකාද්වීපය යටත් වීමෙන් අනතුරුව 1818 සහ 1848 සිදුවූ නිදහස් අරගලයන් පසුබිමේ බුදුදහමේ සහ බුදු සසුනේ පැවැත්මට එල්ලවූ දැඩි බලපෑම් ද හේතු වූ බව ඉතිහාසය පෙන්වා දෙයි. 1847 දී ඉංග්‍රීසිහු දළදා වහන්සේගේ භාරකාරිත්වයෙන් ඈත්වීම, වෙහෙර විහාර, දේවාල සඳහා පැනවූ දැඩි නීතිරීති මෙන්ම භික්ෂුන් වහන්සේලාගෙන් පවා බදු අය කිරීමට පෙළඹීම වැනි රුදුරු තීරණ ඒ අතර මුල් තැනක් ගනී.

ඌව වෙල්ලස්සේ සහ මාතලේ දී පිළිවෙලින් 1818 සහ 1848 ඇතිවූ නිදහස් අරගලයන්හිදී ඊට මඟ පෙන්වූ භික්ෂූන් වහන්සේලා සහ වෙහෙර විහාර වෙත ඉංග්‍රීසින් එල්ල කළ රුදුරු ප්‍රහාරයන් ද මෙවැනි මොහොතක සිහිකළ යුතුවේ.

1848 නිදහස් සටනේ කේන්ද්‍රස්ථානය වන්නේ රංගිරි දඹුලු විහාරස්ථානයයි. එකී අරගල හමුවේ ජාතියේ නිදහස උදෙසා දිවි පිදූ භික්ෂූන් වහන්සේලා සිහිපත් කිරීම ද අපගේ වගකීමකි.

බෞද්ධ දර්ශනයට අනුව අප වෙත ජීවන විමුක්තියේ සහන් පණිවුඩය ලැබුනේ මහින්දාගමනයෙනි. සියලු තෘෂ්ණාවන්ගෙන් මිදී සදාකාලික සුවය ඇති නිර්වාණ සුවය ලැබීම බෞද්ධයන්ගේ පරම චේතනාවය. ඉන් මෙහා අප ලබන සියල්ල තුළ ඇත්තේ දුක් සහිත බවය. අස්ථිර බවය.

මිනිස් චින්තනය සර්ව සම්පූර්ණයෙන්ම නිදහස් නිවහල් විය යුතු ආකාරය කාලාම සූත්‍ර දේශනාවෙන් බුදුරජාණන් වහන්සේ මැනවින් පෙන්වා දෙනු ලැබූ සේක.

දේශපාලන, ආර්ථික, සමාජීය, හෝ වෙන අන් කවර හෝ පටු බැඳීමකට කොටු නොවී කටයුතු කිරීමේ ශ්‍රේෂ්ඨ මානව නිදහස එයම වන්නේය.

අධිරාජ්‍යවාදීන්හු නික්ම යන්නේ ආර්ථික, දේශපාලනික සහ අධ්‍යාත්මක වශයෙන් යළි කිසිඳු දිනෙක අත්මිදිය නොහැකි සංකල්ප ජාලයක අපව සිරකර තබමිනි. 73 වසරක් පුරා අප එය දෙතුන් ගුණයකින් නොව හත් අට ගුණයකින් පටලවාගෙන එහිම ගිලී, එහිම සිරවී පවුල, පන්සල දක්වාම බේද කරගෙන අවසන්ය.

මෙවන් මෝහ ඝනාන්ධකාරයන්ගෙන් මිදීමේ ඒකායන මාර්ගය වන්නේද බුදුදහම නිවැරදිව අවබෝධ කරගැනීමය. පිළිපැදීමය. ඒ අනුව ජීවිතය සකස් කරගැනීමය. ඒ සිදුවන තාක් සැබෑ නිදහස අපට තවත් දුරින් දුරය.

නිමල් කරුණාරත්න (අත්සන)



# නූතන වැඩිහිටි රැකවරණය

වැඩිහිටි සමාජයට කළ හැකි ප්‍රත්‍යුපකාරය වන්නේ සැනසිල්ලේ ජීවත්විය හැකි පරිසරයක් ගොඩනඟා දීමයි. ශාරීරිකව මෙන්ම මානසිකවද පෙරට වඩා දුර්වල තත්වයක සිටින වැඩිහිටියන්ට ලබාදිය හැකි උසස්ම සැළකිල්ල වන්නේ ඉදිරි වසර කීපය තුළ නිදහසේ සැනසිල්ලේ ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකසා දීමය.

මේ සඳහා යෝජනා කරන්නේ Elders ' Society නමැති වැඩසටහනයි.

වැඩිහිටියන් බලාගන්නා සාම්ප්‍රදායික රාමුවෙන් ඉවත් වී වැඩිහිටියන් ජීවත් කරවීමේ නවීන චින්තනය යටතේ මෙය සැකසී ඇත. මෙය ඔවුන් පුනර්ජීවය ලබන වැඩසටහනකි. කාලය ඉකුත් වීමෙන් පැත්තකට විසිකිරීමට නියමිතව තිබූ වැඩිහිටියන්ට ඔවුන්ව අගය කරන, ඔවුන්ව පිළිගන්නා සමාජයක් වෙත නැවත කැඳවාගෙන යාමක් මෙය තුළින් සිදුවේ.

වැඩිහිටියෙකුට ජීවත්වීමට ඉතාම සුදුසු ස්ථානය වන්නේ තමා මෙතෙක් ජීවත් වූ තමාගේම නිවසයි. නමුත් තම නිවසින් තමා බලාපොරොත්තු වන නිදහස, සැනසිල්ල, සතුට රැකවරණය, නිසියාකාරව ලැබෙන්නේ නැතිනම් ඔවුන්ට එවැනි නිදහසක් තිබෙන ස්ථානයකට ගොඩවීම වඩා යහපත් තීරණයක් විය හැකිය. නිවසේ ජීවත්වන දරුවන්ගේ පැත්තෙන් ගත්තත් මෙය නිවැරදි තීරණයත් විය යුතුය. පවතින සමාජ, ආර්ථික රාමුව හමුවේ වැඩිහිටියන් වෙනුවෙන් කැපවීමට ඇති නොහැකියාව තේරුම් ගත යුතුය. දැනට හැකි උපරිමයෙන් වැඩිහිටියන් වෙනුවෙන් වෙහෙසුනත් ඔවුන්ගේ සමාජ හා මානසික අවශ්‍යතා ඉටුකිරීම ඉතා අසීරු වේ.

මේ නිසා සමාජ හර පද්ධතීන් විනාශ වීමට ඉඩ නොදී පවුලේ කාර්යයන් ද රැකගනිමින් වැඩිහිටියන් වෙනුවෙන් ඔවුන්ගේම සමාජයක් ගොඩනැගීම අපේ බලාපොරොත්තුවයි.

වැඩිහිටියන් වෙනුවෙන්ම වෙන්වූ ආයතනයක් ස්ථාපිත කිරීම මෙම Elders' Society නැමැති වැඩසටහනේ බලාපොරොත්තුවයි. මෙම ආයතනය නගරයේ පිහිටුවන අතර ඕනෑම ප්‍රදේශයක වෙසෙන වැඩිහිටියෙකුට මෙහි සේවය ලබාගත හැකිය. වැඩිහිටියන්ට අවශ්‍ය සියලු දේ මෙහි ස්ථාපිත කරන අතර ඔවුන්ගේම ආයතනයක් ලෙස පවත්වාගෙන යාම අරමුණයි. Elder's Society ආයතනයේ මූලික තේමා පාඨය වන්නේ වැඩිහිටියන්ට නිදහසේ සැනසිල්ලේ ඉදිරි කෙටි කාලය ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකසා දීමයි. ඒ සඳහා සියලු දේ ඉටුකිරීමට එම ආයතනය සූදානම්ය.

දරුවන්ගේ අවිවේකී බව නිසා නිවසේ හුදෙකලා වන වැඩිහිටියන්ට මෙම ආයතනය තුළදී තම වයසේ යහළු මිත්‍රාදීන් සමඟ ඉතා සතුටෙන් කාලය ගතකළ හැකිය. තමන්ගේ අදහස්වලට සවන්දෙන පිරිසක් ඒ අදහස් වලට ගරුකරන පිරිසක් මෙහි සිටිති.

එපමණක් නොව ආයතනය සමඟ එකතු වී තම අදහස් ක්‍රියාත්මත කිරීමට ද හැකියාව ඇත.

කෑම බීම, ඉඳුම් හිටුම්, බෙත් හේත් වගේම වැඩිහිටියන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන ආකාරයේ සියලු අවශ්‍යතා ඉටුකිරීමට ආයතනය උත්සාහ කරයි. දිනපතාම වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් රාශියකි. ඒ සියල්ලටම මොවුන්ට සහභාගී විය හැකිය.

වයස අවුරුදු 75 හෝ ඊට වැඩි වැඩිහිටි අය සඳහා වෙනමම සේවක පිරිසක් යෙදවීමට ද බලාපොරොත්තු වේ. මෙම වැඩිහිටියන් මානසික මෙන්ම කායික වශයෙන් දුර්වල තත්වයක පසුවන්නන් නිසා විශේෂ හෙද කාර්ය මණ්ඩලයක් හා උපස්ථායක කාර්ය මණ්ඩලයක් ආයතනය සතු වේ.

ආයතනයට සම්බන්ධව කටයුතු කරන වෛද්‍ය මණ්ඩලයක් ඇති අතර ඕනෑම අවස්ථාවක නේවාසික වැඩිහිටියෙකු වෙනුවෙන් වෛද්‍ය සේවය ලබාගත හැකිය. පවුලේ අය නොසිටියත් අසනීප වන වැඩිහිටියන් සඳහා ඒ අවශ්‍ය සියලු කටයුතු කිරීමට මෙම ආයතනය බැඳී සිටියි.

දරුවන්ට, ඥාතීන්ට තම වැඩිහිටියන් වෙනුවෙන් ඉටුකිරීමට ඇති බොහෝ දේ ආයතනය තුළින් ඉටුකිරීමට උත්සාහ කරයි. වැඩිහිටියන් පිරිසක් ලෙස, කණ්ඩායමක් ලෙස කාලය ගතකරන බැවින් ඔවුන්ගේ තනිකම, කාන්සිය, නැතිවී සැහැල්ලු ජීවිතයක් ගත කරයි.

ඔවුන් කිසියම් ක්‍රියාකාරකමක නිරත වන බැවින් අරමුණක් ඇතිව, බලාපොරොත්තුවක් ඇතිව වැඩ කිරීමට පුරුදු වේ. ඒ නිසා ඊළඟ දවසේ දී කිරීමට බලාපොරොත්තු වන දෙයක් පිළිබඳ බලාපොරොත්තු ඇතිවේ.

ආයතනය දරුවන්ගේත්, ඥාතීන්ගෙන් සහ හිතවතුන්ගෙන් යමක් බලාපොරොත්තු වේ. වැඩිහිටියන් ආයතනයට භාරදුන් පසු ඔහුගේ සුවදුක් බැලීම සඳහා නිතර පැමිණීම ඉතා වැදගත්ය. ඔහුට ඔහුගේ දරුවන්, ඥාතීන්, හිතවතුන් අමතක කළ නොහැකිය. ඔහුට තිබූ මානසික පීඩනය නිසා මෙවන් තැනකට ආවත් නිවසේ අය අමතක කළ නොහැක. ඔහුගේ මනස සමබර වීමට නම් ඒ පවුලේ හිතවතුන් පැමිණිය යුතුය. දුක සැප සොයා බැලිය යුතුය.

දරුවන්ගේ කටහඬ, මුණුබුරු මිණිබිරියන්ගේ දුවන පනින විනෝද වෙන හඬ, මෙය තරම් සිත් ගන්නා දෙයක් තවත් නැත. ඔවුන් ලඟපාතක ඉන්නවා නම් ඊට වඩා දෙයක් නැත. ඔහු තනි වූවා යැයි හැඟීමක් ඇති නොවේ. නිවසේ දී මෙන්ම තවමත් තමන් වටා තම දරුවන් ඉන්නා බවත් ඔවුන්ගේ ආදරය සෙනෙහස ලැබෙන බවත් ඔහුට දැනේ.

පොල්ගොල්ල ශාස්ත්‍රාරවින්ද විද්‍යායතනයේ ආචාර්ය
එල්. වයි. එස්. ගාමිණී

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## සිප්හල වෙත ගියා ඒ ගුරුතුමා යත



ගුරුගල් හින්නෙන් වෑ කන්දට　　පාර
තුරුවැල් නොපෙන්නයි වනගත සරු　　සාර
කරුවල තිඹිරිගස් බැඳගත් කර　　කාර
දරු හුරතල් බලයි පැන පැන යන　　යාර

ඔරුවක හැඩය ඇති ගල අරගෙන　　බාර
බොරු පා බිම දැමූ ගහ බිලිගත්　　මාර
නෙරු ඉදිරියට කලුගල් වෙන්කල　　දාර
බරු ගහනවා නුගමුල් හිතුවක්　　කාර

තිරුවානා වැටිය හැරවූ ගුරු　　පාර
සරු දන් සැල් දමා ඇත මොර පලු　　වීර
නිරුපද්‍රිත ගහේ ඇටුවන් ගෙන　　තෝර
හොරු ලෙස රැදෙනු ඇත උරගයො විස　　ගෝර

ඉරු පොල් අතු බඳින ලද අත්තේ　　කූර
හිරු කුමරුන් මනියි වේයන් කෑ　　යාර
හුරුවෙන පොත පතේ වැඩ දරුවන්　　සූර
වරුවෙන් වැඩි කොටස ගහ යට ඇත　　පේර

දුරු කල දුක දෙපායුග දවසක්　　නෑර
ගුරු පිය තුමා පැමිණෙන සිප්හල　　බාර
ගරු කල හදේ සෙනෙහස ගලකින්　　දෝර
දරුකැල වඳී පා යුග ගණනක්　　වාර



ඔබගේ නිර්මාණ සිව්පද කාව්‍ය නම් කවි 4 - 5 කටත් නිසඳැස් කාව්‍ය නම් පේළි 10-15 අතර නිර්මාණය කර අප වෙත එවන්න.

## සැමහට සෙතක් වේවයි
### අප පවසන්නේ

නවම් මහේ පුන්සඳ පායා　　එන්නේ
මද සීතලෙන් සමනල සිරිපා　　යන්නේ
පිබර සිතින් සැමදෙන සැනසී　　ඉන්නේ
සැමහට සෙතක් වේවයි අප　　පවසන්නේ

පරිසරයත් අලංකාරව හැඩ වී　　එන්නේ
විහගු හඬින් මුළු පෙදෙසම නද　　වන්නේ
ගත සිත පුබුදුවන හැඟුමන් ඇති　　වන්නේ
ආසිරි සමඟ මේ කවිපෙළ　　ලියවෙන්නේ

දිනෙන් දිනම දම්රසයම ලැබ　　ගන්නේ
එමගින් යහපතක් සැමටම　　සැලසෙන්නේ
ඉසිකෝමාන දුරලා සැම　　එක්වෙන්නේ
එවිටයි රටට සැමදා සෙත　　සැදෙන්නේ

සුන්දර සිරිලකට එන අණවින　　දුරුකරමු
රට ජාතියට නිරතුරුවම පණ　　පොවමු
මවුබිම අපේ නිරතුරුවම රැක　　ගනිමු
සාමයෙ කොඩිය අතැතිව ඉදිරියට　　යමු

එක මවකගේ දරුවන් ලෙස ගත　　කරමු
ජාතිය ආගමත් සුරකීමට වෙර　　දරමු
පර ගති සිරිත් අප සිත් තුළ　　නොරඳවමු
සිරිලක් මැණියන් වෙත ආසිරි පුද　　කරමු

අජන්තා ශිරෝමණී දිසානායක
තලවත්තේගෙදර



## මලක පැතුම

වනතුරු ලතා අග මුල් අතු රිකිලි　　කොණ
මම බිහි උනෙමි සුදුමල් බිළිඳකු　　ලෙසිණ
ඉසි කොඩ මංන කිසිවක් නැති ලැම　　නෙතින
විකසිත උනෙමි දසු අත සුවඳ　　කරමින

අඳමිටු කුහක මිණිසත් අය අතර　　ඉඳ
නොහැකිය නිවන් සුව ලැබුමට ගිනි අවියෙ　　මැද
මල් ලොව සුවඳ පිරි සුදු මල් අතර　　ඉඳ
බුදු පුදසුන මතට ගොස් පැතුමක් පතමි　　සොඳ

සැදැහැතියකුගෙ සුරතින් මා නෙලා　　ගෙන
පුදසුන මතුයෙ මා ගෙන ගොස් තබනු　　මැන
ඔහුටත් මටත් ලබනට මතු අමා　　නිවන
බුදු පුදසුනෙහි වැතිරී මම වන්නෙමි　　මිලින

මිහින්තලේ මහකනදරාවේ
ආර්. ඒ. ලීලාවතී පෙරේරා



## අරමුණ සොයා යමු බුදු හිමි දෙසූ පරම

කසාවතක අභිමන් මුලු ලොව　　රැන්දූ
මුසාබස් නොවේ දෙසූ ඒ මධු　　බින්දූ
කසාවතම තම පන මෙන් හද　　රැන්දූ
වසා දෙනෙත් පිරුණා කඳුලැලි　　බින්දූ

දිව ඇද කැපූවත් නොකියූ බොරු　　කිසිදා
මව මෙන් රැකගන්න රට දැය දිවි　　පරදා
අවමන් ලබන්නේ නැත විරුවන්　　සැමදා
ඔබවන් බුදු පුතෙක් යලි බිහිවෙද　　කවදා

මරණය පිළිබඳව හිමි ඔබ කල　　දෙසුම
පරවුන මලක් මෙනි ජීවිතයක　　අරුම
හිරවුණ ජීවිතය නිදහස් කර　　ගැනුම
අරමුණ සොයා යමු බුදු හිමි දෙසූ　　පරම

රුවන් පියසිරි බණ්ඩාර දසනායක

## දුවකට ඔවදන් "ඉවසීම"



තිසරණ සරණ වැද කරනෙමි උදය　　නිමා
මා පිය දෙපල ගුරුවරගෙන් ගතිමි　　සමා
බුදුබණ අතර ඇති ගුණයකි　　ඉවසීමා
දැගෙන කල් ගෙවනු මැන දිවි ඇති　　තෙක්මා

මව්පිය දෙපල ඉටුදෙව්වරු　　දරුවෙන්ට
දායාදයකි දෙන ඔවදන් සැම　　විට
ඉවසීමේ පුරුකෙ අමුණා　　නූලකට
කර පැළඳුවේ පොඩි කල මාගේ　　දුවට

ආර්.ඒ.එච්.එම්.සුමනා කුමාරිහාමි

රංගිරි
ශ්‍රී ලංකා
RSL NEWSPAPER



# සසරින් එතෙරවීමට නම්

**සත්වයා සසරෙහි බැඳ තබන දස සංයෝජන නම් වූ රැහැන් දහයක් ඇත. එනම්,**

**සක්කාය දිට්ඨි**
**විචිකිච්ඡා**
**සීලබ්බත පරාමාස**
**කාමරාග**
**පටිඝ**
**රූප රාග**
**අරූප රාග**
**මාන**
**උද්දච්ච**
**අවිජ්ජා වේ.**

මේ දහයෙන් මුලින්ම සඳහන් තුන දිට්ඨි නිසා සංයෝජනය වේ. දිට්ඨි යනු වරදවා පිළිගැනීමය. වැරදි මතයට ඒමයි. නොපිටට සිතීමයි. මිථ්‍යා දුෂ්ටියකි. දිට්ඨිය යනු ඕඝයකි. භයානක කෙලෙස් ධර්මයකි. ඒවා නැති කළ හැක්කේ විදර්ශනා භාවනාවෙනි.

සම්බුද්ධ ශාසනයක් පහල වූ කළ සද්ධර්මය ලොවට පහල වූ කළ පමණක් මුලින් උපුටා දැමිය හැකි අන් වෙනත් කිසිම කලෙක එසේ නැති කළ නොහැකි විදර්ශනා වෙන්ම නැති කළ යුතු, දුරු කළ යුතු, සමුච්ඡේදනය කළ යුතු බැහැර කළ යුතු කෙලෙස් ධර්ම තුනකි. ආර්යය භූමියේ මුල්බැස ගැනීමට සම්බුද්ධ ශාසනයේ ස්ථාවර වීමට, ආර්ය ශ්‍රාවක භාවය ලැබීමට නිවනට නියත වීමට සම්බෝධි පරායන වීමට සතර අපායෙන් සදහටම අත්මිදීමට ඉහත කී සංයෝජන මුලින් උපුටා දැමීම අනිවාර්යය වේ.

ඒ සඳහා මුලින්ම කළ යුතු පූර්ව කෘත්‍යයන් හෙවත් පෙර සූදානමක් ඇත. එය සපුරාගත යුතුය. එනම්,

- සත්පුරුෂ සංසේවනය
- සද්ධර්ම ශ්‍රවණය
- යෝනිසෝ මනසිකාරය
- ධම්මානු ධම්ම පටිපදාවයි.

මෙකී ධර්මතා ඔබ වෙත විද්‍යමාන වේ නම් ඉහත කී ප්‍රතිලාභ ලැබීමට ඔබට හැකිය. එසේ නොමැති නම් අද අදම සතියෙන් සිහියෙන් යෝනිසෝ මනසිකාරයෙන් ප්‍රායෝගිකත්වයෙන් ප්‍රතිවේධයට පැමිණ නිවනට නියත වූවෙක් වන්න. සංයුක්ත නිකායේ දුතිය සාරිපුත්ත සූත්‍රයේ මේ බව වඩාත් පැහැදිලි කර දී ඇත.

ශාන්ති නායක බුදුපියාණන් වහන්සේ බුද්ධපුත්‍ර ශාරිපුත්ත මහතෙරුන් වහන්සේගෙන් සොතාපත්ති අංග කවරේදැයි විමසූහ.

*"කථමන්නු බෝ සාරිපුත්ත, සෝතාපත්ති අංගන්ති"*
*සප්පුරිස සංසේවෝ හි භන්තේ සොතාපත්ති අංගඞ්*
*සද්ධර්ම සවණං සොතාපත්ති අංගඞ්*
*යෝනිසෝ මනසිකාරෝ සොතාපත්ති අංගඞ්*
*ධම්මානු ධම්ම පටිපත්ති සොතාපත්ති අංගඞ්"*

එහිදී ඉහත ඇසුරින් සෝතාපත්ති අංග පැහැදිලි කර දෙති. බුදුපියාණන් වහන්සේ සාධුකාරදී එය අනුමත කළහ.

ඉහත දැක්වූ ප්‍රතිපදාවට අනුගතවන ආර්ය ශ්‍රාවකයාට පහත දැක්වෙන ප්‍රතිලාභ ද හිමිවේ.

**සුත්වා ච බෝ භික්ඛවේ අරිය සාවතිකො**
ධර්මය ශ්‍රවණය කරන ආර්ය ශ්‍රාවකයා

**අරියානං දස්සාමි**
ආර්ය උතුමන් හදවතින්ම දකී.

**ආර්ය ධම්මස්ස කෝවිදො**
ආර්ය ධර්මය හඳුනා ගැනීමේ දක්ෂ වේ.

**ආර්ය ධම්මේ සුවිනිතෝ**
ආර්ය ධර්මයේ හික්මීම ඇතිවේ.

**සප්පුරිසානං දස්සාමි**
ආර්ය මගඵලලාභින් දකී.

**සප්පුරිස ධම්මස්ස කෝවිදො**
සත්පුරුෂ ධර්මයේ දක්ෂ වේ.

**සප්පුරිස ධම්මේ සුවිනීතො**
සත්පුරිස ධර්මයේ හික්මේ.

**මනසිකරණයේ ධම්මේ පජානාති**
මෙනෙහි කළ යුතු දහම දැනගනී.

**අමනසිකරණියේ ධම්මේ පජානාති**
සිහිනොකල යුතු පාප ධර්මයන් මෙනෙහි නොකරයි.

සක්කාය දිට්ඨිය යනු කුමක්දැයි පළමුව හඳුනාගත යුතුය. සක්කාය යනු පංච උපාදාන ස්කන්ධයට හෙවත් හිතට කියන නමක්. හිත හටගන්නේ ගොරෝසු කය ආශ්‍රිතව ඇති ආයතන හය මුල් කරගෙන ය. මේ හිතත් කයත් දෙක එකතුවූ ජීවිත පැවැත්ම ස්වභාව ධර්මයකි. සුද්ධ ධර්මයන්ගේ හෙවත් ධාතුන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වයකි.

මේ ධර්මතාවය හරිහැටි නොදැන මම, සතා, පුද්ගලයා යනුවෙන් නම් කරගෙන පරිපාලනයට යටත් කරගැනීමට උත්සාහ කර උපාදාන තත්වය ඇති කරගෙන ඇත. සම්මුතිය හා පරමාර්ථය ධර්ම ගැන විද්‍යාත්මක විමසුම මගින් ලෝක ව්‍යවහාරය හා පරමාර්ථ ව්‍යවහාරය පැහැදිලි කර ගැනීමෙන් සක්කාය දිට්ඨිය නැති කරගත හැක.

මජ්ඣිම නිකායේ චූල්ලවේදල්ල සූත්‍රයේත් සංයුක්ත නිකායේ සක්කාය දිට්ඨි සූත්‍රයේත් සක්කාය දිට්ඨිය කුමක්දැයි නිරවුල්ව ඉමේ බො ආවුසො විසාඛ, පඤ්චුපාදානක්ඛන්ධා සක්කා වුත්තො භගවතාති.

විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ පංචඋපාදානස්කන්ධයට සක්කාය යයි දේශනා කරති.

කය හා සිත එකට පරිබද්ධයි. කය වැඩ කරන්නේ හිතක් හටගත්තොත් පමණි. ඒ හිත හටගැනීමට කය උපකාරී වේ. ලෝකය හෙවත් සිත ක්‍රියාකිරීමට කය අත්‍යාවශ්‍යය. මේ දෙකේ එකතුව සංඛාර ගොඩකි. සමූහයකි. පුංජයකි. හේතුවක් නිසා හටගත් ස්වභාව ධර්මයකි. ශක්ති සමූහයක ප්‍රවර්තනයකි.

වේගයක් නිසා ශක්තියක් හටගනී. ශක්ති හතරක සාමූහිකත්වය රූපයකි. රූප දෙකක් එකතුව විඤ්ඤානයාගේ ප්‍රකට වීමයි. විඤ්ඤානය හටගත් වහාම නාම ධර්ම ප්‍රකට වේ. සමූහිකව ප්‍රවර්තනය වන ශක්ති සමූහයක ඇතිවෙමින් නැති වෙමින් පවතින ග්‍රහවස්තුවක් වේ.

මෙයට සතා, පුද්ගලයා, මම, දෙවියා, බ්‍රහ්මයා වශයෙන් පනවාගෙන පුද්ගල ආරෝපණයක් පනවා ගැනීමක් තරයි. ඒ ලෝක සම්මුතිය වේ. මේ සම්මුතිය නිත්‍ය, සැප, ආත්ම වශයෙන් අනවබෝධයෙන් වැරදි පිළිගැනීම දුෂ්ටි ගතවීම එල්බගැනීම සක්කාය දිට්ඨි වශයෙන් හඳුන්වයි. රූපය යනු ස්වභාව ධර්මයත් ශක්තීන්ට ආවේණික ක්‍රියාකාරකමක්.

**සක්කාය දිට්ඨිය යනු කුමක්දැයි පළමුව හඳුනාගත යුතුය. සක්කාය යනු පංචඋපාදාන ස්කන්ධයට හෙවත් හිතට කියන නමක්. හිත හටගන්නේ ගොරෝසු කය ආශ්‍රිතව ඇති ආයතන හය මුල් කරගෙන ය. මේ හිතත් කයත් දෙක එකතුවූ ජීවිත පැවැත්ම ස්වභාව ධර්මයකි. ධර්මයන්ගේ හෙවත් ධාතුන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වයකි.**

15 පිටුවට...

පූජ්‍ය ගම්පහ සිරිසීවලී හිමි

# බුදුපදවිය ලද මහා වීරයාණෝ



සරාසැකි කප් සුවහසක් කල් සපිරූ දානාදී පාරමිතාවන්ගේ අසිරිමත් බල මහිමය ඵල ගැන් වූ විජය ශ්‍රී ජයසිරි මහා බෝධි මූලයේදී දස මරුන් පරදවා තිලොගුරු සම්මා සම්බුද්ධත්වයට පත් අප ශාන්ති නායකයාණෝ එකම මායක එකම දිනයක සිදුකළ මේ සුපින්බර පෙළහර නිසා අන් සියලු ආගම්, ශාස්තෘවරුන් අභිබවා විරාජමාන වෙති.

දඹදිව මධ්‍ය දේශයේ සාධු ජනගහණයට නිකේතනයක් වන් කපිලවත්ථු පුරවරයෙහි උභය කුල පාරිශුද්ධ ශුද්ධෝදන මහ රජුගේ අග මෙහෙසිය යූ මහාමායා දේවියගේ කුස පිළිසිඳගත් අප මහා බෝසතාණෝ වෙසක් පුන් පොහෝදා ලුම්බිණී සල් උයනේදී උපත ලැබූහ. බුදු උපතක අසිරිය ලොවට පාමින් මිහිකත තුරුලේ සුපිපි සත් පියුම් මත විරාජමානව දෙපා තැබූ මේ මහා බුද්ධාංකුරයාණෝ "මම ලොවට අග්‍ර යෙමි, ජ්‍යෙෂ්ඨ යෙමි, ශ්‍රේෂ්ඨ යෙමි" මේ මාගේ අන්තිම ජාතියයි. මින් මතු පුනර්භවයක් නැතැ'යි සිහනද නංවා දෙව් මිනිසුන් සහිත තුන් ලොවම විශ්මිත කරවා පාරමී ගුණ විභූතියෙන් සෝබා සම්පන්න වූහ.

අසිත ඍෂීන් වැනි මහානිසත්වයන්ගෙන් අභිවන්දනයක් ලබා සිද්ධාර්ථ නාමයෙන් සර්ව මිත්‍ර ආදී බ්‍රාහ්මණ ගුරුන්ගේ සිප්සතර හදාරා සොළොස් වියට පැමිණ පූර පක්ෂයේ සොළොස් කලාවෙන් ප්‍රතිපූර්ණ සඳමඩල සේ බබළවන්නට වූහ.

සඳකිඳුරුදාවෙන් සිහිපත් වන සංසාරගත ප්‍රේමයක පූජනීයත්වය බෝසත් බිරියක වී සනාථ කරගන්නට පාරමිතා පිරූ යශෝධරාවන්ගේ අතගෙන රම්‍ය සුරම්‍ය සුබ නමින් වූ ප්‍රසාදත්‍රයෙහි ගිහි සුව විඳි සිදුහත් බෝසතාණෝ ජීවිතයක යථාර්ථය පසක් කරන පෙර නිමිති ෂතරක් දැක මහබිනික්මන් කළෝය.

බුදු බව පතා දන් දුන් ජාලිය ක්‍රිෂ්ණජිනා වන් දරූ සෙනෙහසේ ප්‍රතිමූර්තිය රාහුලයෙකු සේ උපත ලද මොහොතේ කිශාවන්ගේ නිවුණු පදවෙන් ශාන්ත වී ඇසළ සඳ නිසලව බලා සිටියදී කෙලෙස් අනෝමාව තරණය කරන්නට තිර අදිටන් පූරණය වී තිබුණි.

මෙතැන් පටන් නිවීමේ මාර්ගය සොයා යාමේ කාර්යයෙහි යෙදුණු බෝසතාණෝ එකල විසූ ධර්මධරයන් වන භාර්ගව තාපසයන් වෙත ගොස් සසර පුරුදු කළ අනතිමානී සිසු ගුණයන් මොනවට තහවුරු කරමින් දහම් උගත්හ.

සියලු සිප් අධ්‍යයනය කළ ද නිර්වාණ මාර්ගය එහි නොතිබුණු බැවින් පිළිවෙළින් ආලාර කාලාම, උද්දකරාම පුත්ත යනන තාපසයන්ගේ ඇසුරෙහි නිවන් සුව සෙවූහ. තදන්තරව ගයා පෙදෙස් සේනානි නම් සියම් ගම් පෙදෙසට පැමිණ අත්තකිලමකානු යෝගී දුෂ්කර ක්‍රියා පිළිවෙතින් විමුක්ති රසය සොයා ඉන් ලද අත්දැකීමෙන් ශරීරයට අධික ලෙස දුක් දීමත් ශරීරයට අධික ලෙස සැපදීමත් යන අන්ත දෙක ප්‍රතික්ෂේප කළ යුතු වග තහවුරු කරගත් එතුමා මැදුම් පිළිවෙතින් විමුක්ති සාදන මගට සමීප වූහ. සම්බුද්ධත්වය පතා තිර අදිටනින් බෝමැඩ වැඩහුන් මහා බෝසතාණෝ බුදුවී මිස නොනැගිටිමියි සිතා බවුන් වඩත්දී වසවත් මරුන් සපැමිණි වජ්‍රාසනය තමන් සතු යැයි අභියෝග කළහ.

බෝසතාණන් වහන්සේගේ අභිප්‍රාය වන්නේ සත්‍යය හඳුනා ගැනීමයි. සත්‍යය දැකීම මරණය තුළින් කළ යුතු ක්‍රියාවක් බවයි මාරයාගේ ප්‍රකාශය. වජ්‍රාසනය යනු බුදු බවට පැමිණ සත්ත්වයා සසර කතරින් එතෙර කරවන උතුමන් සතු අසුනක් බව බෝසතුන් ප්‍රකාශ කළද මාරයා එය නොපිළිගනී. ඔහුගේ තර්කය වන්නේ සත්‍යය ඇත්තේ මරණය තුළ බවයි.

දුකින් මිදීමේ එකම මඟ මරණය වන මිත්‍යා මතයකි. එය අවිද්‍යාව හා බැඳුණු සංකල්පයකි. මරණින් මතු සියල්ල අවසන් වේය යන සංකල්පය සත්‍යය ලෙස ගත් උච්ඡේදනාදීන්ගෙන් පිරුණු ලෝකය මාරයාට පක්ෂපාතී වියහැකි වුත් චතුරාර්ය සත්‍යය ලොවට හෙළි කරන්නට පහළ වූ උතුමන් වහන්සේ ඊට එකඟ නොවෙති.

සත්‍යය දැකිය යුතු වජ්‍රාසනය හිමි විය යුත්තේ නොව බුද්ධියට බවත් බුද්ධියේ විකසිත මොහොත බුද්ධත්වය බවත් එක හෙලාම විශ්වාස කළ බෝසතාණන් වහන්සේ මාරයාගේ අභියෝග කිසිවකින්වත් නොසැලුනහ.

"මාරය මේ වජ්‍රාසනය ඔබටඅයත් බවට ඇත්තේ කුමන සාක්ෂියක්දැයි බෝසතාණන් විචාල කල්හි සියලු මාර සේනාවෝ අපි සාක්ෂියි. අපි සාක්ෂි හඬ නැගූහ. "ඔබට ඇත්තේ කුමන සාක්ෂියක්දැයි මරුන් විචාල කල්හි මේ වජ්‍රාසනය මට අයත් බවට මිහිකත සාක්ෂි යැයි මහ පොළොවට අත දිගු කළහ. එකල මිහිකත කම්පා වී බුද්ධියටම සත්‍යය අයත් බව තහවුර කර දුන්හ. මාර සේනාවෝ පලා ගියහ. අනතුරුව අප මහ බොසතාණන් වහන්සේ ප්‍රථම ද්වීතීය තෘතීය ආදී වශයෙන් ධ්‍යානයන්ට සමවැදී වෙසක් සඳ වැගී අවරට බැස සඳ කැන් දහරින් ගයා පෙදෙසත් නේරංජනා නදියත් දොවවා සරසාලූ අලුයම සකල ක්ලේෂයන් පරදවා සම්මා සම්බුද්ධත්වයට පත්වූහ.

දුක දුකට හේතුව දුක නැති කිරීම දුක නැති කිරීමේ පිළිවෙත යන සිව්සස් දහමින් තිලොවම එළිය කළ තථාගතයාණෝ සත් සතියක් විවේක සුවයෙන් අවිදූ අඳුරු දුරුවී යන විද්‍යා ඥානය විහිදී යන අමා සුව පිරි සඳහම් දෙසා ලොව සුවපත් කළහ.

**අනේක ජාතිවල සංසාරේ සොයා ආවෙමි**
**වෙහෙස වී**
**පස් කඳ නැමැති මේ ගෙය හදන**
**වඩුව මා තොප දිටිමි**
**සියලු කැණිමඩල සුන් කළෙමි**
**යළි යළිත් ගෙය සාදනු බැරිය**
**තෘෂ්ණාව ක්ෂය කළෙමි**
**එයින් මා ජය ලැබුවෙමි.**

බුදු පදවි ලද මහා වීරයාණෝ උදාන ගීයෙන් ලොවට හෙළි කළේ තෘෂ්ණාවෙන් වෙලී සසර සැරි සරණ අප දුක් කඳ නිමා කළයුතු වන්නේ තෘෂ්ණාවෙන් නික්මී ලද නිවනින් බවයි.

ඒ කරුණා නිධානය ලොවට පහළ වූ අසිරිමත් වෙසක් පුන් පොහොය දිනක් යළි උදා වී ඇත. මේ නැගෙන්නේ එදා ගයා සිරසේ නේරංජනා ගං දිය රැළි අතර සඳ කිරණ හෙලූ සුපුන් සඳමයි.

දසමරුන් ප්‍රමුඛ මාර සේනාවන් පිරිවරා සපැමිණි මාර දිව්‍ය පුත්‍රයා බුදු පදවි ලත් බෝසතුන්ට අභියෝග කළ මොහොතේ මේ ජය අසුන මට හිමි බවට සාක්ෂි දරනු ඇතැයි මහ පොළොවට ශ්‍රී හස්තය දිගු කළ මොහොතේ කම්පා වී සාක්ෂි දැරූ මිහිකතමයි තවමත් අප උහුලා හිඳින්නේ.

ඒ ලොව කම්පා කළ බුදු උපත සකළ සත්තව ප්‍රජාවගේ දුක් නිවන්නටම සිදුවූවක් බැවින් මංමුලා වී අසරණයන් නොවී තවමත් අපි ද උත්සුක වෙමු. මේ අසම සම බුදුවදනින් නිවී සැනසෙන්නට සසර දුකින් අත්මිදෙන්නට.

**ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු**

# නවම් පෝය



සම්බුද්ධ ශාසනයේ සහ සම්බුද්ධ චරිතයේ ඉතා වැදගත් සිදුවීම් රාශියක් සිදුවූ වැදගත් පොහොයක් ලෙස නවම් පොහොය හැඳින්විය හැකිය.

පස්වග මහණුන් ගෙන් ආරම්භ වූ භික්ෂු ශාසනය කෙටි කාලයක් තුළ දහස් ගණනින් ව්‍යාප්ත වන්නට විය. මෙම භික්ෂු පිරිස අතරින් සැරියුත් මහ රහතන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ යන දෙනමට "අග්‍ර ශ්‍රාවක" තනතුර ප්‍රදානය කරන ලද්දේද, නවම් පොහෝ දිනයේදීය. බුද්ධ ශාසනය පිහිටුවා වසර විස්සක් ගතවීමෙන් පසු භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම සඳහා රජගහනුවර වේළුවනාරාමය, කේන්ද්‍ර කොටගෙන "ඕවාද ප්‍රාතිමෝක්ෂය" දේශනා කිරීම සිදුවූයේද නවම් පොහෝ දිනයේදීය. මෙය ප්‍රථම " සංඝ සන්නිපාතය ලෙස ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි. සැරියුත් මහ රහතන් වහන්සේ සහ මුගලන් මහ රහතන් වහන්සේ පිරිනිවීමෙන් පසු අග්‍ර උපස්ථායක ආනන්ද තෙරුන් වහන්සේට බුදුරජාණන් වහන්සේ වදාළේ "සතර සෘධිපාද " වැඩූ කෙනෙකුට අවශ්‍ය නම් "කල්පයක්" වැඩ සිටීමට හැකි බවයි.

ආනන්ද තෙරුන් වහන්සේ මේ වන විට "මාරාවේශව" සිටි බැවින් බුදුරජාණන් වහන්සේට කල්පයක් වැඩ සිටීමට ආරාධනා කිරීමට නොහැකි විය. මේ නිසා බුදුරජාණන් වහන්සේ ආයුසංස්කාරය අත්හැරීමට තීරණය කළ සේක. එය සිදුවූයේද, නවම් පොහෝ දිනයේදීය. තුන්බෑ ජටිලයන් දහම් අසා නිවන් මඟට යොමු වුයේද මෙම පොහෝ දිනයේදීය. මම පොහොය මුල් කරගෙන කොළඹ නගරයේ පෙරහැර පැවැත්වෙන අතර, පිටපලාත්වල පිහිටි බෞද්ධ සිද්ධස්ථානයන්හි දාන, ශීල, භාවනා යන විවිධ පිංකම්වල යෙදෙනු දක්නට ලැබේ. මේ අනුව උතුම් නවම් පොහොය දින ලක්වැසි බෞද්ධ ජනතාවට ඉතා වැදගත්වන බව මෙහිලා සඳහන් කිරීමට පුළුවන.





# පෙරදිග රාජ්‍යයන්හි ථේරවාදී ව්‍යාප්තිය

පැරණි ඉතිහාසයක් ඇති ථේරවාදී බුදුසමය පවතින මෙම රට ඊටත් පෙර මරම්ම දේශය,රාමඤ්ඤ දේශය යන නම්වලින්ද හැඳින්විය.ඉරවඩි නදියෙන් ජලාශ්‍රිත වන මේ රට ශ්‍රී ලංකාව මෙන් දස ගුණයක් විශාලවේ රැන්ගුන් හා මණ්ඩලේ මෙහි ප්‍රධාන නගර දෙකකි.

මියෙන්මාර් දේශයට බුදුසමය පැමිණ ඇත්තේ ලක්දිවට බුදුසමය පැමිනි කාලයේදීය. අශෝක රජතුමා විසින් ධර්ම ප්‍රචාරය සඳහා යැවූ සෝණ හා උත්තර යන හිමිවරුන් වැඩියේ යයි සඳහන් වන ස්වර්ණභූමිය මියෙන්මාර් හෙවත් බුරුම දේශය බව බුරුම බෞද්දයෝ පිළිගනිති.අතීතයේදී මෙරට දියුණුව පැවති බෞද්ද රාජ්‍ය දෙකක් නම් හංසවතී රාජ්‍යය හා සුධම්මවතී රාජ්‍යය වේ.

11වන සියවසේදී ද බුරුමයේදී බුදුදහම දියුණු රාජ්‍ය කළ අනවරථ හෙවත් අනුරුද්ධ රජුටත් ඔහු පුත් කෙයංසිත්ථ රජුටත් එකල බුරුමයේ පැවති බෞද්ධ සංස්කෘතික දියුණුවේ කීර්තිය හිමිවේ. ප්‍රකට ස්වේදගොන් චෛත්‍යය ඉදිවීමද මෙකළ සිදුවිය. එකල බුරුමයේ සෑම කඳු ගැටයක්ම විසල් දාගැබ් සහ විහාර මන්දිරවලින් බැබළුණු බව කියනු ලැබේ.

ලක් බුදු සසුන පිරිහුණු අවස්ථාවක උපසම්පදාව ඇති කිරීම පිණිස පළමුවන විජයබාහු රජු සිල්වත් උපසම්පදාව ඇති කිරීම පිණිස පළමුවන විජයබාහු රජු සිල්වත් උපසම්පදා භික්ෂූන් වහන්සේලා බුරුම දේශයෙන් වැඩම කරවා ගන්නා ලදි. බුරුමයෙන් බුදු සසුන පිරිහී ගිය අවස්ථාවකදී එරට ධම්මචේතිය රජු කෝට්ටේ සිව්වන බුවනෙකබාහු රජු වෙත බුරුම භික්ෂූන් වහන්සේලා එවා සිංහල භික්ෂු සංඝයා වෙතින් උපසම්පදා කරවා ගත්තේය.

වැලිතර අඹගහපිටියේ ඥානවිමලිස්ස තෙරණුවෝ බුරුමයට වැඩ උපසම්පදාව ලබාගෙන පැමිණ 1802 දී ශ්‍රී ලංකාවේ අමරපුර නිකාය ආරම්භ කළහ. 1862දී බුරුම දේශයට වැඩි අඹගහවත්තේ ඉන්දා සහ වරඤාණසාමි මෙරටට පැමිණ රාමඤ්ඤ නිකාය නැමැති භික්ෂු පරපුර ආරම්භ කළහ.

මියෙන්මාර් දේශයට යාබදව නැගෙනහිරින් පිහිටියේ තායිලන්තය හෙවත් සියම් දේශය වේ. මිනෑම් ගංගාවෙත් ජලාශ්‍රිත වන මෙරට බැංකොක් වර්තමාන අගනුවරය.ජනප්‍රවාදයට අනුව තායිලන්තයට බුදුසමය පැමිණ ඇත්තේ ක්‍රි.පූ.3වන සියවසේදීය. ස්වර්ණභූමියට පැමිණි සෝණ හා උත්තර තෙරුන් වහන්සේලාගෙන්ම එරටටත් බුදුසමය පැමිණි බව තායි වැසියෝ පිළිගනිති. ක්‍රි.ව.7වන සියවසේදී පමණ ද්වාරවතී නම් බෞද්ධ රාජ්‍යයක් එරට තිබූ බව හියුං සාං පවසයි.

ක්‍රි.ව.13වන සියවසේ දී තායිලන්තයේදී සුඛෝදය රාජ්‍යයේ සිටි රෝච නම් රජු ශ්‍රී ලංකාවෙන් මහානුභාව සම්පන්න බුදු පිළිම වහන්සේ නමක් ලබාගත් බව එරට ශාසනවංශයේ සඳහන් වේ. සීහල පටිමා නම් බුදුපිළිම වහන්සේලා කීප නමක්ම මේ දක්වාම එරට වැඩ වෙසෙති.

කෝට්ටේ සවන පරාක්‍රමබාහු රජසමයේද තායි භික්ෂූන් වහන්සේලා පිරිසක් මෙරටට පැමිණ උපසම්පදාව ලබාගෙන ගිය බව ඉතිහාස වාර්තාවල සඳහන්ය.ලක්දිව බුදුසමය පිරිහී ගිය අවදියේ වැලිවිට ශ්‍රී සරණංකර හිමිගේ ඉල්ලීම මත 1795 දී මෙහි පැමිණි උපාලි හිමි ප්‍රමුඛ සියම් භික්ෂූන් වහන්සේලා ලක්දිව උපසම්පදාව යළි ඇති කළහ. සියම් නිකාය නමැති භික්ෂු පරපුර ආරම්භ වූයේ එලෙසිනි.


වර්තමානයේ ඛ්මේර් රාජ්‍ය නමින් හැඳින්වෙන පැරණි කාම්බෝජය තායිලන්තයට යාබද ඊට නැගෙනහිරින් පිහිටියේය.මිකොංනදියෙන් ජලාශ්‍රිත මෙහි අගනුවර නොම්පෙන්ග්ය. මෙම දේශය පිළිබඳ මුල්කාලීන තොරතුරු පැහැදිලි නොමැත.12වන සියවසේදී කාම්බෝජ රජුගේ පුත් කුමරකු වූ පින්නාමලින් පැවිදිව ලක්දිව උපසම්පදාව ලද බවට ඓතිහාසික වාර්තා ඇත.

කෝට්ටේ සවන පරාක්‍රමබාහු රජ සමයේදී මෙම දේශයේ භික්ෂූන් වහන්සේලා අටනමක් කැළණියේදී සිංහල භික්ෂු සංඝයා වෙතින් උපසම්පදාව ලද බව ජිනකාල මාලිනී නම් ග්‍රන්ථයේ සඳහන් වේ. වර්තමානය වනවිට රාජ්‍ය ආගම බුදුදහම බවට පත්ව ඇති ඛ්මේර රාජ්‍යයේ රජුගේ සහාය සහිතව භික්ෂූන් වහන්සේලා පාලනය වේ.

ඛ්මේර් රාජ්‍යයට උතුරින් තායිලන්තයට යාබදව පිහිටි ලාඕසය තුළ 14වන සියවසේ සිට බුදු දහම පැතිර ගොස් ඇත. එහි ධර්ම ප්‍රචාරය කළ භික්ෂූන් වහන්සේලා අතර සිංහල භික්ෂූන් වහන්සේලාද වූ බව පෙනේ. වරින්වර ලාඕසය තායි බලයට හෝ කාම්භෝජ බලයට නතුවූ නමුත් එරට ආගමික කටයුතුවලට හානියක් සිදු වූ බව නොපෙනෙන්නේ කාම්භෝජයත් තායිලන්තයත් බෞද්ධ රටවල් වූ බැවිනි.

ඉන්දියාවේ බුදුදහම පිළිබද තත්ත්වය දෙස අවධානය යොමු කරන විට බුද්ධ කාලයේ දී මගධ,කෝසල වැනි රාජ්‍යවල බහුලව බුදුදහම ව්‍යාප්ත විය. ක්‍රි.පූ.3වන සියවසේදී උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක මෙන්ම ඉන්දියාවෙන් පිටතද බුදුදහම පැතිරිණි.කනිෂ්ක රජ සමයත් හර්ෂ රජ සමයත් ඉන්දියාව තුළ බුදුදහම දියුණුව පැවති යුගයන්ය. ක්‍රි.ව.12වන සියවස වන විට ඉන්දියාවේ දේශපාලන බලය මුස්ලිම්වරුන්ට ලැබීමත් සමග මුස්ලිම් අධිරාජ්‍ය තුළ බුදුදහම තුරන්වන්නට විය.

පී.පී.දේශාන් තරුෂික ගමගේ
හොඩගම


සැකසුම හා චිත්‍ර... පාලිත සදුආරච්චි
4
ඒ... කුමක්ද... ඒ.. ..වද.. බෙර.. හඬ.... කවුද..? මරණයට කැපවෙලා තියෙන්නෙ
වහා.. පේවි කාවක් කැඳවා.. මේ ගැන.. විමසන්න ..ඕනි..
ඩං ඩං ධුම්
රාධා... රාධා...
රාධා..! කුමක්ද ඒ.. වද බෙර හඬ.. කවිද- මරන්න ගෙනියන්නෙ.
ධුම් ධුම් ඩං.. ඩං..
අනේ රජතුමානෙ.. අගු- පුරෝහිතගෙ පුත... 'ඉසන්තුන' නැති සිටු කුමාරි අහල තියෙනව නේද...
ඔව්... ඔව්... මා.. ඔහු ගැන ..අසා.. තිබෙනවා...
අනේ.. ඒ.. සත්තක.. මොනක්දෝ වරපතල සොර කමු කට.. අහුවෙලාලු.. අයි සිටු කුම කුමාරිට.. ඒ ගැන කිව්වෙ නැද්ද..
අයි.. සිටු කුමාරි ඒ ගැන දන්නෙ නැද්ද..?
රජතුමා.. ඔහුව.. මරාදමන්න නියෝග දීල... හාව දින තීර- යකින් ඔහුගේ ගෙල කපා මරා දමයි..
අහා...
කුමාරි.. ඔන්න.. දැන් නම්..මේ ළඟින්මයි බෙර හඬ ඇසෙන්නෙ
ධුම් ධුම්
ඩං.. ඩං
රාධා.. අපි බලමු මේ සීමැදුරු කවුළුවෙන් එන්න..

සුරස අතිරේකය

සුභාවිත ගීයක

පෙම්වතියක් ළඳ බොළඳකම් පෑ ගැහැණියම බිරිඳක් බවට පත් වන විට ජීවිතය ගැන බැරෑරුම් ලෙස දකින්නට හුරුවෙයි. කෙළිලොල් සැහැල්ලු බවින් යුතු තරුණිය එතැන් පටන් සිතන්නට පටන් ගන්නේ සිය කුටුම්භය පිළිබඳවය. මේ බිරිඳ මවක් බවට පත් වූ විට ඇගේ ලෝකය බවට පත්වන්නේ ඇගේ දරුවන් ය. ඇගේ සිහින ප්‍රාර්ථනා සියල්ල ගොඩ නැගෙන්නේ තම දරුවන් සහ සැමියා මුල් කරගෙනය.

බිරිඳක් ලෙස සිය යුතුකම් මනාව ඉටු කළ කාන්තාවන් අතරින් අග්‍ර තැනැත්තියක් ලෙස යසෝදරාව හැඳින්විය හැකිය. ඇය සැමියා සහ දරුවන් වෙනුවෙන් කැපවූ ආකාරය ජාතක කතා වල සඳහන් ය. ඇය අවසන් භවයේදී තමා සහ පුතු හැරදමා විමුක්තිය සොයා ගිය සැමියා වෙනුවෙන් කැප වූ අයුරු

හඬන පොඩි පුතු නලවගන්නට නිදන මට රහසින්
රැයේ තුන් යම නිදි වරා ඔබ නොවිඳිනා දුකකින්
කහට පොද ගෙන කුරුළු කූජන සමග ළග හිඳිමින්
සිනා පෑවත් කියාලයි තතු විඩාබර මුහුණින්

ලිහා බත් මුල බුදින මොහොතක මිතුරු කැල සමගින්
වහා දස අත සුවඳ පිරුණා නුඹේ ගුණ සුවඳින්
කම්හලේ දැති රෝද නැගු රළු පරළු හඬ අතරින්
නුඹේ හදවත ගැහෙන රාවය මට ඇසේ රහසින්

අපට අපමය පිහිට පිළිසරණය ද යන හැඟුමින්
සැපත දුක ළග සමව සැනසී නිබඳ ඉවසීමෙන්
මට ද දා වුණ පැටවුණට සහ මට ද අම්මා වන්
සොඳුර නුඹගෙනි එළිය වූයේ උදාවන දිනිඳුන්

*ගේය පද - පොඩිරත්න අඟමලේ*
*සංගීතය හා තනුව - ආචාර්ය රෝහණ වීරසිංහ*
*ගායනය -විශාරද සුනිල් එදිරිසිංහ*

# බිරිඳක් නොවේ ඇය අම්මා කෙනෙක්

යශෝධරාවතෙහි සඳහන් වේ. ඇය තරම් පරාර්ථකාමී නොවුණා ද ඇය ගිය මග අනුගමනය කරන බිරිඳෑවරු අතීතයේ මෙන්ම අදත් සිටිති. පොඩිරත්න අඟමලේ සිය ගීතයට පසුබිම් කරගන්නේ එවන් අප්‍රමාණ කැපවීම් කරන අප්‍රමාණ දයා කරුණා ගුණයෙන් යුතු බිරිඳක හා බැඳුණු සිදුවීමකි.

රාත්‍රියේ වෙහෙසට පත්ව නිවසට එන සැමියා දකින්නේ රෝගීව හඬන පොඩි පුතු නළවගන්නට අසාර්ථක වෑයමක යෙදෙන බිරිඳ ය. මැදියම් රැයේදී එකවරම නින්දෙන් ජිබිදෙන ඔහු දකින්නේ සැමියාගේ නින්දට බාධා නොවන සේ හඬන දරුවා අත තබාගෙන නළවමින් නිවසේ කඩුල්ල ළග ඉඳගෙන බිරිඳ සිටින ආකාරයයි. ඔහුට නැවත නින්දට පිවිසෙන්නේ පසු දින අළුයම නැවත රැකියාවට පිටත්විය යුතු නිසා ය.

උදෑසන පිබිදෙන සැමියාට සුපුරුදු පරිදි කහට කෝප්පයක් ලැබේ. එහෙත් ඇගේ සිනාවෙහි ඇගේ වතෙහි ඇති විඩාබර මලානික ස්වභාවය ඇය හඳුනා ගනී. ඔහු නිවසින් පිටත් වන්නට සූදානම් වන්නේ එදින දිවා ආහාරය මිලදී ගැනීමට සිදුවේ යැයි යන සිතුවිල්ලෙනි. නමුත් නිවසෙන් පිටත් වන සැමියාට සුපුරුදු පරිදි බත් මුලක් ලැබේ.

කම්හලේ වෙහෙසකර පැය ගණනක් ගත කිරීමෙන් පසු මේ සැමියා දිවා ආහාරය ගැනීමට බත් මුල විවෘත කරන්නේ වෙනදා මෙන් සරුසාර රසවත් බත් මුලික බලාපොරොත්තුව අමතක කරමිනි. නමුත් බත් මුල දිග අරින විට සුපුරුදු පරිදි රස නහර පිනා යන ව්‍යංජන කිහිපයක සුවඳ දස අත පැතිරෙයි. මෙලෙස පැතිරෙන්නේ ඇගේ ඇගේ ගුණ සුවඳ මිස අනෙකක් නොවන බව ඔහුට හැඟෙයි. කම්හලේ දැති රෝද වල පරළු හඬ අතරින් අතරින් ඔහුට ඇසුණේ බිරිඳගේ හදවත ගැහෙන රාවයයි.

මෙය ජීවිතේ සිදුවීම් රැසකින් එක් සිදුවීමක් වුවද එම සිදුවීම තුළින් බිරිඳකගේ අප්‍රමාණ කැපවීම හා සෙනෙහස පිළිබිඹුවෙයි. එමෙන්ම මෙම සිදුවීමෙන් බිරිඳකගේ අගය මනාව වටහා ගත් සංවේදී සැමියෙකුගේ හදවත ද පිළිබිඹු වෙයි. බිරින්දෑවරුන් කෙතෙක් කැපවීම් කළ ද එය වදනකින් හෝ අගය කරන සැමියෝ ඉතා විරලය. වර්තමානයේ පවුල් අතර ගැටුම් මතුවී ඇත්තේ සැමියා බිරිඳගේ කාර්යන් සහ බිරිඳ විසින් සැමියාවත් අගය නොකිරීමත් නිසාවෙනි.




මෙම සැමියාට බිරිඳව දැනේනේ මවක ලෙසිනි. ඇය සැබවින්ම බුදුරදුන් දෙසූ පරිදි මාතෘ භාර්යාවකි. මේ කුටුම්භය ආරක්ෂා වන්නේත් එහි ෂතුට සැනසුම රජ කරන්නේත් බිරිඳත් සැමියාත් එක්ව එකිනෙකා මැනවින් තේරුම් ගනිමින් එකිනෙකාගේ දුක සැප බෙදා ගනිමින් ජීවත්වීමෙනි.

වත්මන් සැමියන්ටත් බිරින්දෑවරුන්ටත් පොඩිරත්නයන් මේ ගීතයෙන් ලබා දෙන්නේ අර්ථපූර්ණ ජීවිතයක ආදර්ශයයි. ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ මියුරු තනුව හා සංගීතයත් විශාරද සුනිල් එදිරිසිංහයන්ගේ හඬත් එක්ව සංවේදී සැමියෙකුගේ හදවතින් නැගෙන සිතුවිලි ගීතවත් කරයි. එතුළින් දයාබර හදක් ඇති කැපවීමෙන් කටයුතු කරන ගුණ සුවඳ වහ වහා දසත පැතිරෙයි.

චාමිකා ජනානිද සිල්වා

**ඒ.එල්.බෂාම්ගේ "අසිරිමත් ඉන්දියාව" ඇසුරනි**

# ඕනෑ නම් ඔහේ ඉන්න ඕනෑ නම් පිටතට එන්න



හිරු නගින විට බැස යන සඳ හිරු බසින විට යළි නැග එයි. ඒ මේ ලොව යථා ස්වභාවය ලොවට කියාපාන්නට මෙනි. දින, සති, මාස, අවුරුදු ගෙවෙමින් කාලය ගෙවී යද්දී හිරු සඳු එලෙසින්ම තම දෛනික රාජකාරිය ඉටු කරයි. එසේ ගෙවී යන කාලයේ තවත් එක් වසරක් උදාවී මාසයක් ම ගතවී ගොස් හමාරය. මා මේ ලියන්නේ එවන් ගතවි යන කාලයේ එක් හෝරාවකය.

කාලය කෙසේ කොයි ලෙසින් ගෙවී ගියත් අප සැම කෙනෙකුටම ගෙවී ගිය අතීතයේ යම් යම් සොඳුරු මතකයන් නොනැසී පවතී. සැම රටකටම, ජාතියකටම උරුම වූ සාහිත්‍යාංගයන් ඒ අතර සුවිශේෂී තැනක් ගනී. අප රටේද එසේ ඉතිරි වූ සාහිත්‍යයක් ඇත. ඒ අතර ජන කවි, ජන කතා ද විශාල ප්‍රමාණයක් පවතින අතර වත්මන් සමාජයටද සුවිශේෂී පාඩම් රැසක් ඉන් ඉගෙනීමට ඇත්තේය. නමුත් මා මේ කථා කිරීමට යන්නේ අපේ ජන කවි හෝ ජන කතා ගැන නොවේ. අපේ අසල්වැසි රටක් වන ඉන්දියාවේ සාහිත්‍යාංගයක් පිළිබඳවයි.

එය මා උපුටා ගනු ලබන්නේ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉන්දීය ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය "බී.ඒ, පී.එච්.ඩී, එෆ්,ආර්.ඒ, ඒ.ස් උපාධිධාරි "ඒ.එල්.බෂාම්" මහතා විසින් ලියන ලද "The Wonder That was Ondia" නම් කෘතියේ සිංහල පරිවර්තනය වන "අසිරිමත් ඉන්දියාව" නම් කෘතියෙනි. බෂාම් මහතා මෙය ලියා ඇත්තේ මුසල්මානයන් ගේ ආගමනයට පෙර ඉන්දීය අර්ධද්වීපයේ පැවති සංස්කෘතිය පිළිබඳ සමීක්ෂණයක් ඇසුරිනි. එම ග්‍රන්ථයේ භාෂාව සහ සාහිත්‍යය පිළිබඳව හඳුන්වා ඇති කොටසින් උපුටා ගන්නා ලද්දකි මේ.

ඒවා ද අප රටේ මෙන්ම ගැමි ජනයාගේ දුක, ශෝකය, කඳුල, සුසුම, සතුට, භීතිය, ත්‍රාසය, සොම්නස, දොම්නස කැටි කර ගත් ඒවා විය හැකි යයි එය කියවා අවසන මා හට සිතේ. මා මෙම ලිපියේ මාතෘකාව ලෙසින් උපුටා ගන්නේද එම ජන කවිවල එක්තරා කවියෙකු ලියූ කවියක කොටසකි.

"අප මෙතෙක් කථා කළ සාහිත්‍ය දීර්ඝ සම්ප්‍රධායන් ඇති සාහිත්‍යාසනහ මගින් කරන ඒවායි. සමහර කවි සම්මාන සංස්කෘත සාහිත්‍ය තරම් ක්‍රමානුකූල නැති බව පෙනේ. තැනින් තැන, විශේෂයෙන්ම දෙමළ සාහිත්‍යාවලින් හි හා ප්‍රකෘත "සප්තශතකය්" අපට මුඛපරම්පරාගත ජනකවිවල ස්වභාවයක් යම්තමින් දක්නට ලැබේ.

අප දන්නා තරමින් කිසිම ඉන්දීය ලේඛකයෙකු පැරණි ඉන්දියාවේ ජන කවි එක් රැස්කර නැත. නූතන කවි හා සමාන කර බලන කල වැදගත් ජනකවි රාශියක් තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් කවි කිහිපයක් චීන පරිවර්තන වලින් සුරක්ෂිත වී ඇත.

මේවා ප්‍රාග් ගුප්ත යුගයේ නියම ජනකවි වල කියුම් යයි සිතිය හැක. සංයුක්ත නිකාය නම් බෞද්ධ පිටක ග්‍රන්ථය ක්‍රි.ව 440 පමණ දී චීන බසට පෙරළිණ. එසේ පෙරළෙන ලද්දේ ක්‍රි.ව 411 දී පාහින් විසින් ලංකාවේදී,

"ඇතැම් විට පශ්චාත් ද්‍රවිඩ සාහිත්‍යයේ වැදගත්ම පුරුෂයා වීරමාමුණිවර් (1680-1747)ය. ඒ වූ කර දෙමළ රටේ 36 වසක් ඉගැන්වූ ඉතාලි ජේසුයිට් වරයෙකු වූ කොන්ටන්සියෝ බෙස්කි පියතුමාගේ අපලි නාමයයි.

පැරණි ක්‍රිස්තියානි මිෂනාරීවරුන් බොහෝ දෙනෙක් මෙන් ඔහු සපුරාම ඉන්දීය ක්‍රමයට ජීවත් විය. ඔහු දෙමළ බස මැනවින් උගත්තේය. සාහිත්‍යය රීති ද උගත්තේය.

ඉන් පෙර හෝ පසුව කිසිම යුරෝපියයකු එතරම් හොඳින් ඉන්දීය බසක් උගන්හයි සිතිය නොහේ. බෙස්කිගේ "තෙම්බාවනිය" පැරණි හා අලුත් තෙස්තමේන්තු වල කතා සාටෝප අලංකාර දෙමළෙන් කියන්නකි. ඔහුගේ රීතියත් වස්තු විකාශනයත් සම්ප්‍රදායානුරූපය. එහෙත් ඔහුගේ කෘතිවල මැසෝගේ ආභාෂය පෙනේ. මේ කොටසට කරුණුත් චීන කවිවල පරිවර්තනයත් ආචාර්ය ආතර් වැලිගෙන් ලැබිණ. පළමුවරට ඒවා මෙහි පළකිරීමට අවසර දීම ගැන අපි ඔහුට ඉතා ණය ගැත්තෙමු."

ලබා ගන්නා ලද පිටපතක් බලාගෙනය. මේ පොතේ අග පාලි පොතේ නැති කොටසක් තිබේ. එය පාහියන්ගේ අත් පිටපතේ තිබෙන්නට ඇත. මෙහි තිබෙන කවි ක්‍රි.පූ 1 වන සියවසේදී පාලි පිටක එක් රැස් කරන ලද කාලයත් ක්‍රි.ව 5 වන සියවසත් අතර සමයේදී දඹදිව ගයන ලද ඒවා විය හැකිය.

අප දක්වන ඡේදය නොයෙක් ලෞකික ගීත අසා ඒවා මදක් වෙනස් කොට බෞද්ධ පරමාර්ථයට අනුව හැඩ ගැස්වූ භික්ෂුවක් ගැන විස්තර කරයි. එබැවින් මෙහි පළමුවෙන්ම දක්වනු ලබන කවියට කලින් එන්නේ කරදරයක් නැතිව නිවහනට යන්නට සිතා භික්ෂුව විසින් ගයන ලද්දකි. අනෙක් ඒවාද මෙබඳුම වෙයි. සැමියාගේ පවුල සමග ආරවුල් කරගත් ස්ත්‍රියගේ ගීතය සිය අනියම් බිරිඳ සමඟ විනෝද ගමනක් ගිය ප්‍රියයකුගේ ගීතය

*ගංගා නදිය මට දැන් අවැසි වනුයේ*
*ඔබගේ ගලන දිය හා බැඳී*
*මෘදු සේ මුහුදට පාවන්නටය.*
*මගේ මාමණ්ඩිය හෝ නැන්දම්මා විසින්*
*නිතරම කළහ කරනු ලැබීම*
*වළක්වා ගනු සඳහාය*

*පුහුල් හොරාගේ ගීතය....*
*කාන්තිමත් චන්ද්‍රයාණෙනි,*
*පිටතට නො එන්නැ'යි යදිමි*
*ඉන්නා තැන ඉන්න*
*මා මේ පුහුල් කපන තුරු*
*මා මගේ පුහුල් හසු නොවී ගන ගියාට පසු*
*ඕනෑ නම් පිටතට එන්න*
*ඕනෑ නම් ඔහේ ඉන්න.*

*දුප්පතාගේ ගීතය...*
*මට එක ඌරෙකු ඉන්න තුරු*
*හොඳ මදිරා එක බදුනක් තිබෙන තුරු*
*මදිරා වත් කරන්නට එක බදුනක් තිබෙන තුරු*
*නැවත නැවතත් බදුන පුරවන්නට*
*කෙනෙකු ඉන්නා තුරු*
*මට මේ ටික තිබෙන තුරු*
*මට කිසිවකින් කරදරයක් නැත*

*වර්ෂාව ඇති රැයෙක සිය පෙම්වතා හා*
*නියම කරගත් පරිදි යද්දී පය ලිස්සා මඩේ*
*වැටුණු කෙල්ලකගේ ගීතය*
*මා හිසකේ ලිහලා අවුල් විය......*
*මගේ ලස්සන මාලය ගැඹුරු මඩේ වැටිණ*
*මගේ මුදු හා වළලු කැඩී අවලස්සන විය*
*මා ප්‍රියයා වෙතට ආ විට ඔහුට අදින්නට*
*දෙන්නේ කුමක්ද?*

අපේ පහසුව හා විනෝදය ට පෙම් සිතුවිලි බරට අපි නිල් තුරු සෙවණේ රැඳෙමු
ගලන නදිය වේගයන් පිවිතුරුව ගලයි
මගේ වීණාවේ හඩ ගීතවත්ය, මිහිරිය
අපේ සැපයට වැඩි සැපයක්
කොතැනක නම් ඇත්ද?

කොබෙස්සතුට අවවාද
කොබෙය්ය, ආහාර රැස් කර ගන්න තල, වී මෙනේරි ආදිය එක් රැස් කර කඳු මුදුනේ ගසකට ගෙන යන්න ඉතා උසින් ඔබේ කුඩු ගුහාව තනා ගන්න එවිට අහසින් දිය වැටෙන කාලයෙහිදී ඔබට වාසස්ථාන, ආහාර පාන නො වරදවා ලැබේවි

මෙයට අනුව බලන කල අපට පෙනී යන්නේ සිංහල ජන කවිය හා සමානවම ගැමි සරල සුගම බස් වහරකින් ඉන්දීය ජන කවියද සැදෑ ඇති බවකි. ගැමි ජනයාගේ කඳුලේත් සිනහවේත් අපූර්ව සංකලනයක් මෙයින්ද පෙන්නුම් කරන බව මා හැඟී සිතිවිල්ලකි.

**එස්.දිල්රුක්ෂි අබේකෝන්**

# රංගිරි දඹුලු රජමහ විහාරය



මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ වගපනහපල්ලේසිය පත්තුවේ පිහිටි රංගිරි දඹුල්ල රජමහ විහාරය වූ කලී ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා සෞන්දර්ය අංශයන්හිද අතිශය වැදගත් වන්නාවූ බෞද්ධ සිද්ධස්ථාන අතර සුවිශේෂී ස්මාරයකි.

ජාතික ඉතිහාසයේ ද, ආගමික ඉතිහාසයේ ද සංධිස්ථානයක් සනිටුහන් කරන මෙම රංගිරි දඹුල්ල රජමහා විහාරය ක්‍රිස්තු පූර්ව යුගයේ ආරම්භව මහනුවර යුගය තෙක් ක්‍රමික සංවර්ධන විකාශනයට පත් වූ විහාරස්ථානයකි.

ස්වභාවික ලෙනක පිහිටි මෙහි ප්‍රතිමාලය 05ක්. එය තුල බුද්ධ ප්‍රතිමා, බෝසත් ප්‍රතිමා, සහ රාජ ප්‍රතිමා ඇතුළු ප්‍රතිමා 154කි කළු ගල්, ගඩොල්, ලී මාධ්‍ය උපයෝගි කර ගනිමින් මෙම ප්‍රතිමා නිර්මාණය කර තිබේ.

ලෙන් සිවිලිමස හ ආවරණ බිත්ති සම්පූර්ණයෙන්ම සිතුවම් කොට තිබේ. වර්ග අඩි 22,000 පමණ ප්‍රමාණයෙන් බිතු සිතුවම් පවති. එබැවින් මේ සා විශාලල බිතු සිතුවම් ප්‍රමාණයක් ශේෂව ඇති ලෝකයේ විශාලතම ලෙන් විහාරය රංගිරි දඹුලුල රජමහ විහාරය යැයි හැඳින්වීම නිවැරදිය.

යුනෙස්කෝ ආයතනය දඹුල්ල රජමහා විහාරය "ජගත් උරුම බිම් කඩක්" ඔයැ උදරකා ායැරසජ්ටැ ීසඑැ, වශයෙන් ප්‍රකාශයට පත් කොට තිබේ. මෙම අනගි භවනීය සිද්ධස්ථානය ගැන පළමු වරට ශාස්ත්‍රීය පර්යේශ නිබන්ධයක් කිරීමේ ගෞරවය කැළණි විශ්ව විද්‍යාලයේ ඉතිහාසය අංශයේ මහාචාර්ය මංගල ඉලංගසිංහ ශූරීන්ට හිමි වේ. එම නිබන්ධය 1987 දී "දඹුලු විහාරයට" නමින් ප්‍රකාශයට පත් කරන ලදී.

"රංගිරි දඹුල්ල රජමහා විහාරය" නමින් එළිදකින මෙම ග්‍රන්ථය එහි සංස්කරණයකි. ඒ සඳහා අනුමැතිය ලබා දුන් මහාචාර්ය මංගල ඉලංගසිංහ මහතාටත්, ජයාරූප සපයා දීමෙන් සහ එය මෙම ග්‍රන්ථයට උචිත පරිද්දෙන් සංස්කරණය කල ජයාරූප ශිල්පී ගාමිණී ජයසිංහ මහතාටත්, මෙම ග්‍රන්ථය මුද්‍රණය කර දුන් කොළඹ මරදාන පාරේ "යුනිගැපික්" ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂ තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මෙහිලා මම බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. එසේම මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයටද මෙහිලා මගේ ස්තූතිය පළ කරමි.

නම සහ ඉතිහාසය

දඹුලු විහාරය පිළිබඳ ලියැවුණු ග්‍රන්ථ කීපයකුත් ලිපි රාශියකුත් ඇත. මෙම ග්‍රන්ථ හා ලිපි හැම එකකටම වාගේ පදනම් වී ඇත්තේ මෙම ස්ථානය ගැන වංශකථාවල එන තොරතුරු මහනුවර යුගයේ මෑත භාගයෙහි ලියැවිණැයි සිතිය හැකි තුඩපත් කීපයක් හා ජනප්‍රවාදය. දඹුලු විහාරය ගැන ලියූ නූතන ලේඛකයන්ගෙන් මහාචාර්ය පරණවිතාණ හැර අන් කිසිවකුත් විහාරයට ව්‍යවහාර වූ පැරණි නම සෙවීමට සැබෑ උත්සාහයක් දරා නැති බව පෙනේ.

දඹුලු විහාරයට ව්‍යවහාර වූ පැරණි නම සෙවීමට පළමු කළ යුතුව ඇත්තේ, මෙම ස්ථානය දඹුල්ල නමින් හැඳින්වූයේ කවර හේතුවක් නිසා ද යන්න සොයා බැලීමය. මහාවංශයෙහි දෙවෙනි භාගයෙහි (චූලවංශය 1) පළමුවන විජයබාහු (1055 - 1110) රජු විසින් ජම්බුකෝළ විහාරයෙහි කරවූ ප්‍රතිසංස්කරණ කටයුතු ගැන කියැවෙයි. මහා පරාක්‍රමබාහු දෙවන ගජබාහු (1132 - 1153) සමඟ කළ සටන්වල එක් අවස්ථාවක් දී සේනාව පිරිවරා ජම්බුකොළයට පැමිණිබව වංශකථාව කියයි. කලාවැව ප්‍රදේශයේ කෙරුණ සටන්වලින් පසුව පිළිවෙලින් කසාගල්ල (වර්තමාන කහල්ල) තටවාපිකය, (වර්තමාන තලකිරියාගම) යන ස්ථාන පසුකරමින් ජම්බුකොළයට පැමිණ බව කියැවෙන හෙයින් මෙය ජම්බුකොළ පට්ටන නමින් ප්‍රසිද්ධ වූ උතුරේ වරාය නොව වර්තමාන දඹුල්ල බව මැනවින් පැහැදිලිය. මෙයින් හෙළිවන තවත් කරුණක් නම් පොළොන්නරු යුගයේදීත් අද මෙන්ම දඹුලු විහාරය පමණක් නොව ඒ අවට ප්‍රදේශයත් හැඳින්වීම සඳහා දඹුල්ල යන නම ව්‍යවහාර වූ බවය.

"දඹුල්ල" යන වචනය පාලි භාෂාවට පෙරළීම නිසාත් වංශකතාවම අනුගමනය කළ ලේඛකයන් එම පරිවර්තනය එසේම අනුගමනය කිරීම නිසාත් සිදුවී ඇති වැරදි රාශියකි. "ජම්බුකොළ" "දඹකොළ" වීමත් "දඹකොළ""ජම්බුකොළ" වීමත් වාග් විද්‍යා රීතින්ට අනුකූල ය. එහෙත් "දඹුල්ල" "ජම්බුකොළ" වීම මෙන්ම "ජම්බුකොල" "දඹුල්ල" වීම ද කිසිම වාග් විද්‍යා රීතියකට අනුකූල නොවන පද සිද්ධියකි. සිදත් සඟරා කතුවරයා පෙන්වා දුන් "වහරනු සෙරෙත්" (ව්‍යවහාර අනුසාරයෙන්) බැලුවත් මෙය නොගැලපෙන බව පෙනේ. මේ තත්වය අවබෝධ කරගත් විශාරද උගතකු වූ මහාචාර්ය පරණවිතාන "විශ්වගිරි" "යවකොල" වී එය පසුව දඹුල්ල වූයේ "ජබුකොල" "ජබෝල" දඹුල්ල යන ආකාරයට යයි පවසයි. මහාචාර්ය පරණවිතාන මේ පද සිද්ධියට පාදක කොටගත් ප්‍රබන්ධය තරමටම, මේ පද සිද්ධිය ද හේතු සාධකවලින් තොරය. "දඹුල්ල" යන වචනයෙහි ප්‍රභවය සොයා ගිය තවත් පඬිවරයෙකු වූ මැදඋයන්ගොඩ විමලකීර්ති හිමියෝ "දඹතල" (දඹගස් බහුල උන්නත භූමිය) "දඹුල" "දඹුල්ල" වශයෙන් මෙම පදය සැදුණැයි පවසති.

මෙයද පෙරකී පද සිද්ධි මෙන්ම තේරුම් ගැනීමට අපහසු අමාරුවෙන් තනාගත් එකකි. ඒ හැරත් දඹුලු උන්නත භූමිය දැන් නම් දඹගස් නොව වීරගස් බහුල එකක් බව පෙන්වා දිය යුතුය. පැරණි සිංහල ගමක නමේ ප්‍රභවය සොයා පාලි භාෂාව කරා යාම මහාවංශ කතුවරයා සිංහල නම් හා වචන පාලියට පෙරළීම නිසා සිදුවූවකි. විශේෂයෙන් මහාවංශයෙහි දෙවැනි

iv පිටුවෙන්....

පොතපත ඇසුරෙන්

iii පිටුවෙන්....

භාගය සුපරික්ෂාකාරිව කියැවුවහොත් පැරණි සිංහල ග්‍රාම නාම පාලියට පෙරලීමට යාම නිසා ඒවා කොතරම් දුරට තේරුම් ගැනීමට අපහසු ද දෝෂ සහිත ද යනු මැනවින් පැහැදිලි වේ.

අපගේ අදහස දඹුල්ල "ජම්බුකොළ" යනුවෙන් පාලියට පෙරළීම සාවද්‍ය බවය. එසේම "ජම්බුකොළ" යන වචනයෙන් "දඹුල්ල" යන සිංහල වචනය බිඳුණේ යයි සැලකීමත් වාග්විද්‍යාත්මක වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන්ද වැරදි බවය. ඓතිහාසික ජම්බුකොළ පට්ටනය හා දඹුල්ල හා කිසිම සම්බන්ධයක් ලංකා ඉතිහාසයේ කිසිදාක දක්නට නොලැබේ. ජම්බුකොළ පට්ටනයෙන් වැඩමවන ලද ශ්‍රී මහා බෝධි ශාඛාවෙන් උද්ගතවී යයි සඳහන් වන සප්තඵලරුහ බෝධින්ගෙන් එකක් පැළ කළ තැනක් ලෙස දඹුල්ල සඳහන් නොවේ. දඹුල්ල පිළිබඳව එන කිසිම ජනප්‍රවාදයක ද මෙවැනි පුවතක් සඳහන් නොවෙයි. මේ ප්‍රදේශ දෙකෙහි පදිංචි වූ ආයර්‍ය කණ්ඩායම් අතර වූ සම්බන්ධතාවයක් දැක්වීමට ද සාදක නැත. මේ හැර ජම්බුකොළ පට්ටනය (වර්තමාන සම්බිලිතුරෙයි) හා දඹුල්ල අතර දුර ප්‍රමාණය සැතපුම් සියයකට අධිකය.

දඹුලු විහාරය "ජම්බුකොළ ලෙන" නමින් පළමුවරට ඓතිහාසික මූලාශ්‍රයක සඳහන් වන්නේ පළමුවන විජයබාහු රජතුමාගේ කාලයේදී බව ඉහතින් පෙන්වා දුනිමු. පොළොන්නරු යුගයට අයත් ප්‍රධාන රජවරුන් තුන්දෙනාගේම (මහා විජයබාහු, මහා පරාක්‍රමබාහු, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල) කාලවල දී මෙම ස්ථානය හෝ විහාරය ගැන සඳහන් වන නිසා එම යුගයේදී දඹුල්ල ලංකාවේ රජවරුන්ගේ අවධානයට ලක් වූ තැනක් වශයෙන් පැවැති බවට සැකයක් නැත. "ජම්බුකොළ ලෙන" සමග වංශකථාවෙහි සඳහන් වන සියලු විහාරස්ථානවල විජයබාහු රජතුමා විසින් කරවූයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිසා පෙනී යන්නේ ඒ වන විට රජයට පැවති අන් විහාරස්ථාන මෙන්ම දඹුලු විහාරය ද පරසතුරු ආක්‍රමණ නිසාත් අභ්‍යන්තර යුද්ධ කලකෝලාහල නිසාත් පාලකයන්ගේ පිළිසරණ නොලැබ ජරාවාස තත්වයට පත්ව තිබූ බව පාලකයන්ගේ අවධානයට ලක්වූ ජනතාවගේ ගෞරවාදරයට පත්වූ පූජ්‍යස්ථානයක් වශයෙන් පැවැති බව පෙන්වාදීමට මේ සටහන හොඳ සාධකයකි.

කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු දඹුලු විහාරස්ථානයෙහි කරවූ කටයුතු ගැන තරමක විස්තරයක් වංශකථාවෙහි එයි. මේ විස්තරය අනුව රජු ස්වර්ණ රජතයෙන් උසස් වැ බබළන බිත්ටැහ්වලින් අතිශයින් විරාජමාන, රන් උළුයෙන් සෙවෙණි කළ, දැහිගුලෙන් කළ බිම් ඇති, කමණිය වූ ජම්බුකොළ නම්, විහාරය පිළිසකර කරවා එහි තෙසැත්තෑවක් පිළිම රන් ආලේප කැරවීය. මේ විස්තරයෙහි ඇති වැදගත්කම නම් කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ කාලය වන විට දඹුලු විහාරස්ථානය පැවති තත්වය එයින් ප්‍රකාශ වීමය. විහාරය හුදු ගල්ලෙන් සමූහයක් වශයෙන් නොව අඩුම තරමින් ප්‍රතිමා හැත්තෑතුනක් ඇති, ඉදිරිපස බිත්ති මෙන්ම ඒවා ආවරණය කළ අලංකාර වහලකින් ද යුක්ත වූ එහි ගෙබිම පවා වර්ණනාවට යෝග්‍ය වූ දැ හිඟුලෙන් පිරිමැද තුබූ බව මෙයින් පැහැදිලි වෙයි. රන්මුවා යනුවෙන් අදහස් කරන ලද්දේ "රන් උළු" නොව "රන්වන් උළු" බවට සැකයක් නැත. බිත්ති ඇතුළත මෙන්ම පිටතද නෙත් සිත් පැහැර ගන්නා සායම් තවරා තුබූ බව ඒ පිළිබඳ සඳහනින් පෙනේ. නිශ්ශංකමල්ල රජු පිළිම තෙසැත්තෑවක් රන් ආලේප කිරීම විහාරයෙහි පෙනුමට යෝග්‍ය අයුරින් කරන ලද ක්‍රියාවක් ද නො එසේ නම් බුදු පිළිම රන් ආලේප කිරීමේ පුරුද්දට මේ වන විට



ඇබ්බැහිව සිටි බුරුමය වැනි අග්නිදිග ආසියාතික රටවල් අනුගමනය කිරීමක් ද යනු නොදනිමු. මේ රජුගේ කාලයෙහි පොළොන්නරුවෙහි ඉදිවූ සමහර ගොඩනැගිලි දෙස බලන විට මෙය අග්නිදිග ආසියාතික බෞද්ධ රටවල්, විශේෂයෙන් බුරුමය අනුගමනය කිරීමක් බව සිතා ගැනීමට අපහසු නැත.

නිශ්ශංකමල්ල රජු අන් රජුන් මෙන් නොව තමා විහාරස්ථානයෙහි කළ කටයුතු එහිම ශිලා ලිපියක් කොටවා සටහන් කර



තැබීම වැදගත්ය. මෙහි එන විස්තරය වංශකථා විස්තරයට බෙහෙවින් ම සමාන වන අතර, රජුගේ සෙසු ලිපි මෙන්ම ඔහුගේ දේශපාලන හා ආගමික කටයුතු ගැන ද විස්තර කරයි. මේ හැර නිශ්ශංකමල්ල රජතුමාගේ ප්‍රීතිදානක මණ්ඩප පුවරු ලිපියේ ද ගල්පොත නමින් සුප්‍රසිද්ධ ලිපියෙහි ද දඹුලු විහාරය ගැන සඳහන් වෙයි.

මේ ලිපි තුනෙහිම විහාරස්ථානය ගැන සඳහන් වන්නේ "දම්බුලු ලෙන" වශයෙනි. විහාරස්ථානයට ඒ වන විට පොදු ජනතාව භාවිතා කළ නම "දඹුලු ලෙන" හෝ "දඹුලු විහාරය" බව එයින් නිසැකවම පැහැදිලි වෙයි. චූලවංශය (මහාවංශයෙහි දෙවැනි කොටස) ලියැවුණේ නිශ්ශංකමල්ල රජුට පසු කාලයක බව පිළිගෙන ඇති නිසා මේ රජුගේ ලිපි මේ විහාරස්ථානය එම නමින් සඳහන් කරන මුල්ම මුලාශ්‍රය වශයෙන් පිළිගැනීමෙහි වරදක් නැත. අප කළ විමසුම් වලින් පෙනී යන්නේ දඹුලු විහාරය (හෝ ලෙන) එම නමින් මීට පෙර ලියැවුණ කිසිම පාලි හෝ සිංහල මූලාශ්‍රයක සඳහන් නොවන බවය.

මෙම විහාරය අනුරාධපුර යුගයෙහි ව්‍යවහාර වූයේ කවර නමකින් දැයි විමසා බැලීමේ දී පැන නගින ප්‍රධාන දුෂ්කරතාව වන්නේ එයට පොළොන්නරු යුගයේ දී හා ඉන්පසුව ව්‍යවහාර වූ නම අනුරාධපුර යුගයට අයත් කිසිම මූලාශ්‍රයක සඳහන් නොවීමයි. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ලගේ ලිපිය හැර තවත් ශිලා ලිපි තිස් හතරක් දඹුලුගලේ බටහිර හා වයඹ දිසාවන් පුරා පැතිර ඇති ලෙන් වලින් සොයා ගෙන ඇතත් එයින් එකම ලිපියක් හැර අනිත් සියල්ලම මේ කාරණයෙහිලා ප්‍රයෝජන රහිත වේ.

කෙසේ වුවද නිශ්ශංකමල්ලගේ ශිලා ලිපිය පොළොන්නරු යුගය වන විට විහාරස්ථානයට භාවිතා වූ නම "දම්බුලු ලෙන" හෝ "දඹුලු විහාරය" ය යන්න බව අපට පැහැදිලි කරයි. මෙම වචනයේ පාලියට පෙරලූ පසුකාලීනයෙකු වූ වංශකථා කතුවරයා එම පරිවර්තනයෙන් කර ඇති වරද මුලදී ම පෙන්වා දුනිමු. අප වංශකථා පරිවර්තනය නොපිළිගන්නේ නම් "දම්බුලු" හෝ "දඹුලු" (දඹුල්ල) යන වචනයෙහි නියම ප්‍රභවය කුමක් යන ප්‍රශ්නය මෙහි දී පැන නැගේ. මෙම වචනය සෑදීමට මුල් වූ ප්‍රධාන කරුණු දෙකක් ගැන අපේ අවධානය මෙහි දී යොමුවේ.

දඹුලු විහාරය අද වුවත් ජනතාව අතර ප්‍රසිද්ධියක් ලැබීමට ප්‍රධාන හේතු දෙකක් ඇත. එක් හේතුවක් නම් එය විවිධ යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා හා චිත්‍ර අති විශාල සංඛ්‍යාවකින් සමන්විත කලා නිකේතනයක් හා අද්විතීය පූජ්‍යස්ථානයක් වීමය. අනික් හේතුන නම් මෙහි ඇති විහාර මන්දිර පහෙන් විශාලතම වූ මහරජ විහාරය නමින් හැඳින්වෙන විහාර මන්දිරයේ දකුණු කෙළවරේ ගල් පැල්ලමකින් නිරතුරුව රූරා වැයෙන දිය බිඳුවය. මේ දිය බිඳුවෙන් කටාරමක එකතුවන ජලය ප්‍රයෝජනයට ගැනෙන්නේ පූජා කටයුතුවලට පමණකි. මේ දිය බිඳුව වැහීම විහාරස්ථානයේ ඉතිහාසයේ කවර වකවානුවක ආරම්භවී දැයි නිශ්චය කිරීමට සාධක නැතත් මෙම පූජ්‍යස්ථානයට "දඹුලු ලෙන" හෝ "දඹුලු විහාරය" යන නම ගෙන දීමට එය හේතුවක් වූ බව අපගේ අදහසයි.

"දඹ" යන සිංහල වචනයෙන් එක්තරා වන පලතුරු ගස් වර්ගයක් (දඹගස්) මෙන්ම විශාල පර්වත ද හැඳින්වූ බව පෙනේ. ශ්‍රී පාදස්ථානයට නගින්නෙකුට හමුවන විශාල පර්වත ප්‍රදේශය හැඳින්වෙන්නේ "මහගිරිදඹේ" යනුවෙනි. පර්වත හැඳින්වීම සඳහා වූ "ගිරි" යන්න එලෙසම තිබියදී "දඹ" වචනයෙන් ව්‍යවහාර කිරීම වාග්විද්‍යානුකූලය.

"උල්" යන්නෙන් "උලක්" මෙන්ම "ජලය" ද ගම්‍යවේ. "ඌල" යනු උල්පත සඳහා ව්‍යවාහර වූ පැරණි සිංහල වචනය බව සිදත් සඟරාවෙන් ද පෙනේ. මේ අනුව "දඹයෙන් වැහෙන ඌල" (පර්වතයෙන් වැහෙන උල්පත) නිසා මෙම විහාරස්ථානය දඹ ස ඌල ස පෙන හෝ විහාරය වී පසුව ව්‍යවහාරයේදී දම්බි ස උල දඹුල ස දඹුල් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ බව පිළිගත හැකිය. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල ගේ දඹුලු ලිපිය, ප්‍රීතිදානක මණ්ඩප පුවරු ලිපිය හා ගල්පොත යන ලිපිවල ඇති "දම්බුලු" යන වචනය "දඹුල්ල" යන වචනයේ ඓතිහාසික විකාශනය පිළිබඳ එක් අවස්ථාවක් පැහැදිලි කරයි. මෙය දඹුලු විහාරය පිළිබඳ එන ජනප්‍රවාදවල ද "දඹුල්ල" යන වචනය සෑදීම පිළිබඳව එන එක් මතයක් වෙයි. මේ අනුව මෙම විහාරස්ථානයට ව්‍යවහාර වන වර්තමාන නම එහි සුප්‍රසිද්ධ දිය බිඳුව නිසා ඇති වූවක් බවත්, එම නම පොළොන්නරු යුගය වන විට ප්‍රසිද්ධියට පත්ව තිබීම නිසා විහාරස්ථානයේ ආදී ඉතිහාසය සෙවීම දුෂ්කර තත්වයකට පත්වන බවත් පැහැදිලි වෙයි.

එහෙත් දඹුල් විහාරයේ ඉතිහාසය ලංකාවේ බුද්ධාගමේ ඉතිහාසය තරම් ම පැරණි බව පැහැදිලි වන්නේ පර්වතයේ විවිධ ස්ථාන වලින් සොයා ගෙන ඇති විශාල බ්‍රාහ්මී ලිපි සංඛ්‍යාව නිසාය. දැනට මෙවැනිලිපි තිස් හතරක් සොයා ගෙන ඇත. බුද්ධාගම ලංකාවට හඳුන්වා දී ගත වූ මුල් ශතවර්ෂ කීපය තුළ භික්ෂු සංඝයාගේ වාසය සඳා පසු කල මෙක් විශාල විහාර ආරාම තැනීමෙ පුරුද්දක් නෙපැවතියේය. දේවානම් පියතිස්ස රජතුමා තම මඟුල් උයන මිහිඳු මාහිමියන් ඇතුළු ධර්මදූත පිරිසගේ වාසය පිණිස පූජා කළත් අපිස් සතොස් ජීවිතයක් ප්‍රියකළ උන්වහන්සේලා නගරයෙන් බැහැර නිසසල පරිසරයක වූ මිහින්තලය වැනි තැන්ම සිය වාසය පිණිස තෝරා ගත්හ. මේ ආදර්ශයෙන් පැහැදුණ රජ පවුලේ උදවිය ඇතුළු සැහැදැතියන් තම තමන්ගේ ප්‍රදේශවල වූ ගල්ලෙන් පිරිසිදු කොට වැහි ජලය නොවැටෙන සේ කටාරම් කොටවා මහා සංඝයා විෂයෙහි පූජා කළ අයුරු ක්‍රි.පූ තුන්වන සියවසේ සිට ක්‍රි.ව පළමුවන සියවස දක්වා විහිදෙන දීර්ඝ කාල පරිච්ඡේදය තුළ දිවයිනේ විවිධ ප්‍රදේශවල වූ ගල්ලෙන්වල කටාරමයෙහි කොටවා ඇති කෙටි

15 පිටුවෙන්...

03 පිටුවෙන්....

ඒ අනුව රටක ඇතිනීති පද්ධතියත් ආරක්ෂා කර රටේ පැවැත්ම උදෙසා සිත, කය, වචනය යන තිදොරින්ම සංවරයක් ඇති පුද්ගලයෙකු වශයෙන් කටයුතු කළ යුතුය. එය බුදුරජාණන් වහන්සේ දේශනා කළ විනය නීති ආරක්ෂා කිරීමේ මූලික පිළිවෙතයි. තිදොරින් සංවර වූවා යනු අනුනට හා සමාජයට යහපත කැදවන්නෙකු වන්නේය. එවිට අලුතෙන් නීති ආරක්ෂා කිරීමක් අවශ්‍ය නැත. මේ උතුම් පුන් පොහෝ දිනය තුළ බුදුරජාණන් වහන්සේ උගන්වා වදාළ එම උතුම් ගුණාංගයන් ආරක්ෂා කිරීමට අපි සිතට ගනිමු.

හතර වෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ අනාගතයේ සිදුවිය යුතු දේ කලින් ප්‍රකාශ කර සිටීමකි. බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් ලෝක සත්වයාට (දෙවි මිනිසුන්ට) ධර්මය දේශනා කළහ. එසේ ධර්මය දේශනා කළ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට මාස තුනක් තිබියදී චාපාල චෛත්‍යය අසලදී ආයු සංස්කාරය අත්හැර මෙයින් තෙමසකට පසු පිරිනිවන් පාන බව භික්ෂූන් වහන්සේලාට දේශනා කළ සේක. එයින් සැබෑ ශාස්තෘවරයෙකුගේ ලක්ෂණ පෙන්නුම් කරති.

අද සමාජය තුළ වුවද ඕනෑම පුද්ගලයෙකුට තමන්ගේ ජීවිතය පිළිබඳ ස්ථිර වශයෙන් යමක් කිව නොහැකි වුවද තමන් ලැබූ පදවි තානාන්තර වලින් සමුගැනීමේ දිනය, විශ්‍රාම යන දිනය කිව හැකිය. ඒ සඳහා කල්වේලා ඇතිවම සූදානම් වී සිටීම ඉතාම වැදගත් වේ. ජනතාවගේ වැඩි කැමැත්තක් නැතිව ආරාධනාවක් නැතිව එම තානාන්තර වල ඇලී ගැලී සිටීම නුසුදුසුය. ජනතාවගේ ප්‍රතිචාරය අනුව එම නිලතල වල සිටීම හෝ එයින් ඉවත්වීම සිදු කළ යුතුය. ලොව උතුම්ම පදවිය ලබාගත් බුදුරජාණන් වහන්සේට වුවද වසවත්ති මාරයාගෙන් ගැලවීමට නොහැකි විය. එසේ නම් සෑම කෙනෙක්ම මරණයට පත්වන බව සිතා තම වගකීම් හා යුතුකම් කොටස ඉෂ්ඨ කරමින් මෙලොව පරලොව ජයග්‍රහණය කිරීමට මේ උතුම් පුන් පොහෝ දිනය තුළ අදිටන් කර ගනිමු.

11 පිටුවෙන්...

# නිවනින් එතෙරවීමමට නම්..

වේගයක් නිසා හටගත් දෙයක්. මේ දැනුවත් බව නැති නිසා රූප උපාදානය වේ.ස්වභාවිකයි. එහි යථාර්ථය ගැන නොදැනීම, නොදැනුවත් බව නිසා සංඥා උපාදානය කරගනී.

සංඛාර යනු ස්වභාව ධර්මයකි. හටගත්තා වූ අර්ථයෙන් ක්‍රියාකාරක අර්ථයෙන් සංඛාර නම් වේ.

හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් දෙයකි. ඊට ආවේණික ක්‍රියාකාරකම් එහි විද්‍යාමාන වේ. මේ යථාර්ථය නොදැනීම නිසා සංඛාර ධර්ම උපාදානය කරගනී.

විඤ්ඤානය යනු ස්වභාව ධර්මයකි. සත්වයා සම්බන්ධව විද්‍යාමාන වන ආයතන හෙවත් ස්වභාව ධර්මයන් ඇසුරු කරගෙන ප්‍රකට වන තවත් ස්වභාව ධර්මයකි. යථාර්ථය හෙවත් ප්‍රකෘතිය මූලස්වභාවය ගැන නොදැන ගැනීම නිසා විඤ්ඤාන උපාදාන ස්කන්ධය හටගනී.

මේ පංච උපාදානස්කන්ධයම ස්වභාව ධර්මයකි. පඨවි ආදී මූල ශක්ති පදනම් ව ප්‍රකට වන්නාවූ, විද්‍යාමාන වන්නාවූ ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වයකි. විදසුන් නුවණින් මේ බව නොදැනීම නිසා නොවෙනස්ව පවත්නාවූ සතෙක් පුද්ගලයෙක් මමෙක් පනවාගෙන නිත්‍ය සැප, ආත්ම සංඥාවෙන් දුෂ්ටි ගතවීම සක්කාය දිට්ඨිය වේ.

අත්දැකීම්, විඳගැනීම, හැඳිනගැනීම්, ක්‍රියාකාරකම් සළායතන සම්බන්ධයෙන් සිදුවේ. මෙහි පුද්ගලයෙකුගේ ක්‍රියාකාරිත්වයක් නොපළවේ. ක්‍රියාවක් ඇත. කරන්නෙක් නැත. කම්මස්ස කාරකො නත්ථි"

නිවනට නියත වීමට මඟ හෙළිපෙහෙළි කරන සතර සතිපට්ඨානයේ කායගතානු සතිපට්ඨාන පරිච්ඡේදයේ ධාතුමනසිකාර පබ්බය නම් වූ කොටස හොඳින් අධ්‍යයනය කර ලෝකය හෙවත් පංච උපාදානස්කන්ධය නම් වූ ස්වභාව ධර්මය හටගත් ස්වභාව යෝනිසෝ මනසිකාරයෙන් අධ්‍යයනය කර විදසුන් නුවණින් දැක භව නිරෝධය කරන්න.

iv පිටුවෙන්....

## රංගිරි දඹුළු රජමහ විහාරය

බ්‍රාහ්මී ලිපි දහස් ගණනකින් මැනවින් පැහැදිලි වේ. හේ හැම ලිපියකින්ම පාහෙ කියැවෙන්නේ එම ලෙන පූජා කළ දායකයාගේ හෝ දායිකාවගේ නමත්, එය සතර දිගින් වැඩි මහා සංඝයාට පුද කළ බවත්ය.

ඇතැම් ලිපියක තත්කාලීන රජුගේ නමත්, පූජාවට භාජනය වූ ලෙන හැඳින්වූ නමත් සඳහන් වේ. සමහර ලිපියක දායකයාගේ හෝ දායිකාවගේ ඥාතී සම්බන්ධතා ගැනද සඳහන් වේ. එසේම ඔහු හෝ ඇය ඉසුලූ සමාජ තරාතිරම නිල තනතුරු හෝ විරුදනාමත්, අයත් වූ ගෝත්‍රය, පරපුර හෝ කුලයන් සඳහන් වේ.

දඹුලු පර්වතයේ විවිධ තැන්වලින් සොයාගත් බ්‍රාහ්මී ලිපි හැම එකක ම පාහේ ආදී බ්‍රාහ්මී ලිපිවලට පොදු ඉහත සඳහන් කළ ලක්ෂණ එකක් හෝ වැඩි ගණනක් දක්නට ලැබේ. මෙයින් එක් ලිපියක දෙවනපිය ගමණි තිස - නම් මහ රජකු ගැන සඳහන් වන අතර තවත් ලිපියක ගමණි අබය නම් මහ රජකු ගැන සඳහන් වේ. බ්‍රාහ්මී ලිපි පිළිබඳව විශිෂ්ට අධ්‍යයනයක් කළ මහාචාර්ය පරණවිතාන ගේ මතය අනුව මහරජ විරුදයෙන් හැම විටම පාහේ සඳහන් වන්නේ දිවයිනේ තත්කාලීන ආධිපත්‍යය දැරූ මහරජු බවට සැකයක් නැත. දඹුල්ලෙන් සොයාගත් තවත් ලිපි හතක පරුමක විරුදය ඉසුලූ පුද්ගලයන් ගැන සඳහන් වේ. මෙම විරුදය ඉන්දියාවේ දී හැම විටම වාගේ භාවිතා වූයේ කිසියම් ශ්‍රේණියක හෝ ගණයක ප්‍රධානියකු හැඳින්වීමට වුවත් මහාචාර්ය පරණවිතානගේ අදහස අනුව ලංකාවේ භාවිතා වී ඇත්තේ මහාවංශයෙහි හා රසවාහිනියෙහි "ඉස්සර" (ඉසුරු) නමින් හැඳින්වෙන ගම් ප්‍රධානීන් හැඳින්වීම සඳහාය. මොවුහු ලංකාවේ ඉන්දු ආර්ය ජනාවාස බිහිකළ ආදී පුරුෂයන්ගෙන් පැවතෙන්නෝ වූහ.

දඹුල්ල සහ අවට පෙදෙස් ආර්ය ජනාවාස බවට පත්වූයේ ආර්යයන් මෙරටට පැමිණ ජනාවාස බිහිකළ මුල්ම අවධියේ දී බව දැක්වීමට මේ ලිපි කදිම සාධකයකි. දඹුල්ල අවට ඇති, ඇඹුල් අඹේ, කණ්ඩලම, එඬේරගල, පිදුරංගල, සීගිරිය, දිගම්පතහ යන ස්ථානවලින් ද මෙනිම බ්‍රාහ්මී ලිපි රාශියක් සොයා ගෙන ඇත. මේ ලිපිවලින් රාශියක් පරුමකවරුන් ගැන සඳහන් වන අතර දඹුල්ලට සැතපුම් හයක් පමණ ගිණිකොණ දිගින් වූ ඇඹුල්අඹේ ලෙන් වලින් සොයාගත් ලිපි තුනක්ම පචීනරජ (ප්‍රාචින රාජ) නම් කෙනෙකු ගැන සඳහන් වේ. මෙයින් එක් ලිපියක "පචින රජුගේ පුත් අභය පුත් තිස" (තිස්ස) නම් රජකු ගැන සඳහන් වේ. මේ පරම්පරාව ගැන මීට වඩා සාදක ලැබී නැතත් ඔවුන් අනුරාධපුරයෙන් නැගෙනහිර දිග (ප්‍රාචීන දේශ) වූ මෙම ප්‍රදේශය පාලනය කළ රජ පවුලක් බව සිතිය හැකිය.

ඓතිහාසික මූලාශ්‍රවලින් තහවුරු කිරීම සෑහෙන තරම් අපහසු පරම්පරා කථා අනුව දඹුලු පර්වතය සොයා ගත්තේ වට්ටගාමිණී අභය (වළම්බා) (ක්‍රි. පූ. 103 සහ 89 - 77) රජුගේ කාලයේ වන අතර එහි ඇති ලෙන් විහාරවලින් පශ්චිම විහාරය, මහරජ විහාරය හා දෙව්රජ විහාරය නමින් හැඳින්වෙන විහාර මන්දිර තුන කරවන ලද්දේ මේ රජතුමා විසිනි. දඹුල්ලේ හා ඒ අවට ඇති ඉහත සඳහන් කළ බ්‍රාහ්මී ශිලා ලිපි ශාස්ත්‍රීය විග්‍රහයකට භාජනය කිරීමෙන් පෙනෙන්නේ අනුරාධපුරයට සමීප ප්‍රදේශ තරම්ම දියුණු ආර්ය ජනාවාස බවට පත්ව තුබූ එම ප්‍රදේශයේ වූ දඹුලු පර්වතය වට්ටගාමිණී අභය රජුගේ කාලයේදී සොයා ගැනීම ගැන මෙම පරම්පරා කථාවන්හි එන සඳහන එතරම් විශ්වාසය තැබිය නොහැකි බවයි. මෙම පර්වතය ආදිම ආර්ය ජනාවාස බිහිවූ උතුරු දිග තැනිතලාවේ කැපී පෙනෙන ස්ථානයක තිබීමත් රජරටත් මලය රටත් සම්බන්ධ කළ මහා මාර්ගයේ වැදගත් සන්ධිස්ථානයක පිහිටීමත් නිසා ක්‍රමයෙන් සංඛ්‍යාවෙන් වැඩිවන මහා සංඝයාගේ වාසස්ථාන සපයා දීමෙහි උත්සුක වූ සැදැහැවතුන්ගේ නෙතට එය ලක්වූයේ දේවනම්පියතිස්ස රජුගේ කාලයේදීම නොවී නම් ඒ සමීප වකවානුවේ දී යයි නිගමනය කිරීම එතරම් අපහසු නොවේ.

මේ සඳහා උපයෝගී කරගතහැකි ප්‍රධාන සාධකයක් නම් මහරජ විහාරය නමින් හැඳින්වෙන ලෙන් විහාරයට උඩින් වූ කටාරම යටින් කොටවා ඇති බ්‍රාහ්මී ශිලා ලිපියයි. මෙම කටාරම එක් පසකින් දෙව්රජ විහාරය නමින් හැඳින්වෙන ලෙන පටන් ගන්නා තැනින් කෙළවර වන අතර, අනික් පසින් පශ්චිම විහාරය නමින් හැඳින්වෙන ලෙන තෙක් විහිදේ. අඩි 25ක් තරම් දිගට විහිදී ඇති මෙම ලිපිය මෙසේය.

"දෙවනපිය මහරජශ ගමණි තිශශ මහලෙණ අගත අනගත චතුදිශ ශගශ දිනේ (දේවානම්පිය ගාමිණී තිස්ස මහරජුගේ මහ ලෙන සිව්දිගින් ආ නොආ මහා සංඝයාට දානය කරන ලදී)


දඹුල්ලෙන් සොයාගත් ලිපිවලින් මහරජ කෙනෙකු විසින් ලෙනක් පිදීම පිළිබඳව සඳහන් එකම ලිපිය මෙයවීම වැදගත්ය. "දෙවනපිය" යනු දේවානම්පියතිස්ස මහරජුගේ පටන් පියවස් කීපයක් ගතවන තුරු ලංකාවේ මහරජවරුන් භාවිත කළ ජනප්‍රිය විරුදයකි. එසේම"ගමණි" යන්නත් මුල් යුගයේ බොහෝ රජවරුන් විරුදයක් ලෙස භාවිත කළ බවට සාධ ලැබී ඇත. මෙම ලෙණ පිදූ මහරජතුමාගේ පුද්ගල නාමය සොයා ගැනීමට ඇති එකම උපකාරය "තිශ" යන වචනයයි. තිස්ස නමින් හැඳින්වූ රජුන් කීපදෙනෙකුම බ්‍රාහ්මී ශිලා ලිපි යුගයට අයත් වෙතත් මහාචාර්ය පරණවිතානයන්ගේ මතය අනුව මේ ලිපියෙන් හැඳින්වෙන රජු අන් කිසිවෙකු නොව මුල්ම බෞද්ධ රජවූ දොවානම්පියතිස්සය. මෙතුමා කලක් මේ රජු සද්ධාතිස්ස ලෙස විශ්වාස කළත් පසුව එම විශ්වාසය හැරදමා දේවානම්පියතිස්ස යයි නිගමනය කළේ කවර සාධාරණ හේතුන් මත දැයි පෙන්වා දී නැත. ලිපියෙහි අක්ෂර රූප හා වාග් විලාශය පදනම් කරගෙන මෙම නිගමනයට එළඹුණේ නම් එය සාධාරණ නොවන්නේ මුල්ම බ්‍රාහ්මී අක්ෂර යුගයට අයත්වන තවත් "තිස්ස" රජවරුන් සිටීම නිසාය. ප්‍රථම බෞද්ධ රජතුමා වූ දේවානම්පියතිස්ස විසින් කරවූ හැම වෙහෙ විහාරයක්ම නම් වශයෙන් සඳහන් කිරීමට අමතක නොකරන මහාවංශ කතුවරයා දේවානම්පියතිස්ස දඹුලු විහාරය වැනි පුළුල් ලෙස පැතිරුණ ලෙන් විශාල සංඛ්‍යාවකින් යුතු තැනක විහාරාරාම තැනවීමෙහි හෝ ලෙන් කැණවීමෙහි යෙදුණේ නම් එය සඳහන් නොකර හරිතැයි සිතීම සාධාරණ නොවේ.

දඹුල්ල වැනි අනුරාධපුරයෙන් තරමක් දුර බැහැර වූ ලෙන් ඇති තැන් ගැන සැලකිල්ල යොමුවූයේ අනුරාධපුරයට සමීප ප්‍රදේශවල ලෙන් විහාර භික්ෂු සංඝයාට පිදීමෙන් පසු අලුත් තැන් සොයා ගැනීමේ අවශ්‍යතාව පැන නැගුණ කාලයක යයි සිතීම අනුචිත නොවේ. දේවානම්පියතිස්ස ගෙන් පසු ඔහුගේකනිටු සොහොයුරන් කීපදෙනෙක් ම රජ බවට පත්වූහ. මෙයින් තුන්වැන්නා වූ සූරතිස්ස (සුවණ්න පිණ්ඩ තිස්ස) අන්හැම සොහොයුරකුටම වඩා බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කළ බව මහාවංශය ඔහු ගැන කරන විස්තරයෙන් පෙනේ. වංසකථාව අනුව මේ රජු ලංකාද්වීපය පුරා තැනින් තැන විහාරාම පන්සියයක් කරවීය.

ඉතිරිය ලබන කාලාපයෙන්...

රංගිරි
ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2021 පෙබරවාරි - 2564 නවම් කලාපය

# ඉදිරියට යා යුත්තේ ධර්මඥානයත් සමඟය



බුද්ධ ශාසනය භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිව්වනක් පිරිසකගෙන් යුක්ත වූවකි. ඔවුන් ප්‍රතිපත්ති මාර්ගයක් ඔස්සේ ගමන් කරන්නෝය. බුදුරජාණන් වහන්සේගේ ධර්මය වනාහි ප්‍රඥාවන්තයින් උදෙසා පවතින්නකි. මෝඩයින් ධර්මයෙන් ප්‍රයෝජන නොගනී. එබැවින් සිව්වනක් පිරිස අතරින් භික්ෂු - භික්ෂුණී නිතරම ධර්ම ගවේෂී විය යුතුය. නිකම්ම නිකම් මහල්ලෙක් වීම ප්‍රඥාවන්ත ක්‍රියාවක් නොවේ. ගිහි වේවා, ධර්මයෙන් සන්නද්ධව වයසට යෑම බුදු සමය අගය කරන්නකි.

ධම්ම පදයෙ ධම්මට්ඨ වග්ගය තුළ 6වෙනි ගාථා ධර්මය තුළින් දේශනා කොට ඇත්තේ ඒ පිළිබඳ අදහසක්ය. අද බොහෝ දෙනෙක් බුදු සසුන යැපීමේ ක්‍රමෝපායක් කොට ගෙන ඇත. ගෙවල් දොරවල් ඉදිකොට සියලු කම්සැප විඳ කෙසේ හෝ චීවරයක් දවටාගෙන ලාභ සත්කාර ඔස්සේ හිස් මහල්ලන් කල් යවති. එවැනි පිරිස් බුද්ධ කාලයෙහිද සිටියහ. බුදුරදුන් පිරිනිවීමෙන් පසු සුභද්‍ර නම් භික්ෂුවගේ අභද්‍ර වචනය තුළින් ඒ බව මනාව පැහැදිලි වේ.

ධර්මඥනයෙන් නොදියුණු එවැනි මහලු පිරිස් උදෙසා බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කොට ඇත්තේ ''මෝඝජිණ්ණ'' හෙවත් හිස් මහල්ලා යනුවෙනි. ඒ අනුව අද වුවද බුදු සසුන තුළ කිසිදු ධර්මඥානයක්, හික්මීමක්, විනයක්, වැඩිහිටි ගෞරවයක් නොමැති නිකම්ම වයසට ගොස් කල් යවන භික්ෂූහු සිටිති. ගිහි පක්ෂයේ ද එවැනි පිරිස් සිටිති. බුදු සසුනට ඔවුන්ගෙන් ලොකු විනාශයක් සිදුවේ. භික්ෂුවකගෙන් විය යුතු සේවාව දැන හඳුනාගෙන බුදු සසුනටත්, දායක පින්වතුන්ටත්, සමස්ථ ජනතාවටත් යුතුකම් ඉටු කළ යුතු අයුරු සිඟාලෝවාද සූත්‍රය තුළින් පැහැදිලි කොට ඇත. එනම්,

- පාපා නිවාරෙන්ති - පවින් වැළැක්වීම
- කල්‍යාණෙ නිවෙසෙන්ති - සුචරිතයෙහි පිහිටුවීම
- කල්‍යාණෙන මනසා අනුකම්පන්ති - යහපත් සිතින් අනුකම්පා කිරීම
- අස්සුතං සාවෙන්ති - නො ඇසූ ධර්මය අසන්නට සැළැස්වීම
- සුතං පරියොදපෙන්ති - ඇසූ ධර්මය පිරිසිදු කිරීම
- සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති - නිවන් මඟ පසක් කිරීම

ඉහත සඳහන් කරුණු හය තුළින් භික්ෂුවක් විසින් පින්වතුන්ට සංග්‍රහ කළ යුතුය. නිකම්ම වයසට ගිය භික්ෂුවක් තුළින් ඉහත කරුණු ඉටු නොවනු ඇත. වර්තමානය තුළ ඉහත කරුණු තුළින් ගිහි පින්වතුන් උදෙසා එම සේවාව නිසියාකාරව සිදු වනවාද යන්න පිළිබඳ විමසා බැලිය යුත්තකි. වගකිව යුතු භික්ෂූන් වහන්සේලා ඊට මුල් වී උපාසක උපාසිකාවන්ගේ අධ්‍යාත්මික ගුණ වර්ධනය ඇති කළ යුතුව ඇත. සැදැහැවතුන්ගේ පැහැදීම වඩවන අයුරින් හික්මීමකින් හා බහුශ්‍රැත බවකින් තම යුතුකම් කොටස ඉටු කළ යුතුය.

**යම්හි සච්චං ච ධම්මොච**
**අහිංසා සඤ්ඤමො දමො**
**සවේ වන්තමලො ධීරො**
**ථෙරො ඉති පවුච්චති**

යමෙක් හිසකෙස් පැසුණු පමණකින් ස්ථවිර නම් නොවෙයි. ඔහුගේ වයස මුහුකුරා ගියා පමණෙකි. ස්ථවිර බව ඇති කරන සීලාදී ධර්ම ඔහු තුළ නැති හෙයින් ඔහුට හිස් මහල්ලා යයි කියනු ලැබේ.

වයසට යෑම ස්වභාවික දෙයක් වුවද එය අවතක්සේරු නොකොටගෙන ජීවිතයට වටිනාකමක් දීම ඉතා වැදගත් වේ. ඒ සඳහා උතුම් කරුණු ග්‍රහණය කළ යුතුය. හිස් මහල්ලා යනුවෙන් ගිහි පැවිදි දෙපක්ෂයටම ආමන්ත්‍රණය කළ හැකිය. හිස් යනු කිසිදා ධර්මඥානයක්, ගුණ ධර්මයක් ප්‍රගුණ නොකර සිටීමෙන් ඇතිවන සූන්‍ය බවය. අපේ සිත හිස් වූ කල්හි අපට ලොකු බියක් සැකක් හටගනී. නොපිරුණු කළය නිරන්තරයෙන් සෙලවෙන්නාක් මෙන් සිතද කාමාදි කෙලෙස් තුළින් සැලෙනු ඇත. එබැවින් නිරතුරුවම ධර්මඥාණය ප්‍රගුණ කළ යුතුය. දහම් කරුණු රැස්කොට බහුශ්‍රැත විය යුතුය. නැතිනම් සිදුවන්නේ මිය යෑමේදී හිස්මිනිසෙක් වශයෙන් මිය යෑමටය. එය ඊළග භවයට බලපාන්නකි. මෙලොව දෙලොවම යහපත් කරගැනීමට හිස් නොවූ කෙනෙකුවීම ඉතා වැදගත් වේ.

''පුත්තා මත්ථි ධනං අත්ථි -
ඉති බාලො විහඤ්ඤති
අත්තා හි අත්තනො නත්ථි - කුතො පුත්තො
කුතො ධනං''

(මෝඩයාම දරුවෝ ඇත්තාහ. මට පුතුන් ඇත ධනය කියා සිතමින් වෙහෙසෙයි. තෙමේද තමහට නැත.මෙසේ තිබියදී පුත්‍රයෝ කොයින් ලැබෙත් ද? ධනයක් හෝ කොයින් ද?)

එදිනෙදා ජීවිතය තුළ පුහුදුන් සත්වයා නිරතුරුවම වෙහෙසෙන්නේ අඹු දරුවන් පෝෂණය කිරීමටත්, ධන සම්පත් තව තවත් සෙවීමටත්ය. එයට හේතුව ජීවත්වන කාලය තුළ මරුවා කොයි වේලෙ අප කරා පැමිණෙන්නේද යන්න පිළිබඳ වැඩි අවධානයක් නොසිතන බැවිනි. ලෝවැඩ සඟරාවේ සඳහන් වන්නේ ''අද අද එය මරු පින් කරගන්නේ'' යනුවෙනි. රාගයෙන් රත්වී, ද්වේශයෙන් දූෂිත වී මෝහයෙන් මුලාවී අන්ධකාරයෙහි ජීවත්වීමට අනුවණ සත්වයා හුරු වී සිටිති. අඳුරෙන් අඳුරට යනවා විනා අඳුරෙන් ආලෝකයට යන්නෝ ඉතා සීමිතය.

එයට හේතුව එවැනි අයට ලෝකය හා සත්වයා දෙස ප්‍රඥාවෙන් බැලීමට තරම් ඔවුන්ගේ චින්තන ශක්තිය නොදියුණු වී තිබීමය. ලෞකික සැප සම්පත් කෙරෙහි වෙහෙසෙන පුහුදුන් සත්වයාට නිරන්තරයෙන් මතු වන්නේ කාම සිතුවිලිය. ඒවා හරියට තමන් විනාශ කිරීමට පැමිණෙන සතුරන් බඳුය. නමුදු ලෝකය හා සත්වයා දෙස අධ්‍යාත්මික දියුණුවක් ඇතිව ජීවත් වන්නන් යම් තරමකින් හෝ සැහැල්ලු ජීවිතයකට ඇල්මක් දක්වති. තෘෂ්ණාවෙන් අන්තගාමී පුද්ගලයා පළගැටියා ගිනි දැල්ලට හසු වී විනාශ වන්නාක් සේ අන්තගාමීව ජීවිතය අකාලයේ විනාශයට පත්කර ගනිති. කොතරම් ධන සම්පත් ඉපයුවද දූ දරුවන් පෝෂණය කළද කොතරම් භෞතික සම්පත් සඳහා වෙහෙසුනද අවසන් ගමන යන්නට සිදුවන්නේ කිසිවෙකුගේ පිහිටක් නොමැතිවමය. ඒ බව දැන හඳුනාගෙන මරණානුස්සතිය මෙනෙහි කිරීම උභයාර්ථ සංසිද්ධිය පිණිස ම හේතුවනවාට කිසිදු සැකයක් නැත.

**''අර්ථඃ ගෘහෙ නිවර්තන්තේ - ක්‍ෂමශානෙ මිත්‍ර බාන්ධවඃ**
**සුකෘතං දුෂ්කෘතං චෛව - ගච්ඡන්ති මනු ගච්ඡති''**

(පවුලේ අය තනියට නිවසේද, යාලු මිත්‍රයින් සොහොන දක්වාද, සිටියද එතනින් එහාට යෑමේදී තමාගේ තනියට කරපු හොඳ නරක දෙක පමනක් පසුපස ගමන් කරයි)

එසේ වුවද වර්තමාන සමාජය තුළ සිදු වන්නේ කෙනෙක් මිය ගියාට පසු මරණානුස්සතිය වඩනවා වෙනුවට ප්‍රීතිය සතුට වඩවනු වස් සුරා සූදු දුරාචාරවලට ඇබ්බැහි වී අනිත්‍ය, සංකල්පය වෙනුවට නිත්‍ය, සුඛ ආත්ම සංකල්ප ඇති කරගන්නා බවකි. ඒ තුළින් බාල පරපුර වුවද ඒවා අනුකරණය කරමින් ජීවිතය අකාලයේ විනාශ කරගනු ඇත.

උපන් සත්වයා මරණයෙන් කෙළවර වේ. බුදුරජාණන් වහන්සේගේ දේශනය වන්නේද උපන් සත්වයා පින් කරගත යුතු බවය. එසේ නම් මළගමක් වූ කල්හි එවැනි තැන්වල හැසිරිය යුත්තේ කෙසේද? යන්න පිළිබඳ බෞද්ධ ජනයා මීට වඩා සිතිය යුතු වන්නේය. මළගෙයක් වූ කල්හි අප හැසිරිය යුතු වන්නේ අනිත්‍ය සංකල්පයත් සමඟය. මියගිය කෙනා දෙස ප්‍රඥාවෙන් බැලිය යුතුවන අතර එහිදී සිහි කළ යුත්තේ මමද මේ අයුරින් මරණ ධර්මතාවයට පත් වන්නෙක් බවය. මේ මරණ ධර්මතාවයට මුහුණ දීමට සිදු වන්නේය. මටද මරණය ඉක්මවා යෑමට නොහැකි බවය. එවිට පිළිවෙලින් භාවනාවක් වශයෙන් නව සීවථිකය, දස අසුභය ආදී ශරීරයේ විපර්යාස ස්වභාවයන් ද ස්මරණය වනු ඇත. එයම භාවනාවකට යොමු වී යථාර්ථය පසක් වීමටද රුකුලක් වනු ඇත. ලෝවැඩ සඟරාවෙහි සඳහන් කවි පදයක් මතකයට නගා ගැනීමෙන්ද ඒ බව තවත් තහවුරු වේ.

''අද අද එයි මරු පින් කර ගන්නේ
කෙලෙසද සෙට මරු නේති සිතන්නේ ''

(මාරයා එන එක හෙට අනිද්දා හෝ තව කාලයකට හාරදී නොසිටිය යුතුය. අද අදම මාරයා තමා කරා එන බව සිතිය යුතුය)

1.දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන සිවු සස් දහම - සච්චං
2.සතර මඟ - සතර පල හා නිවන යන නව ලොව්තුරා දහම - ධම්මෝ
3.මෙත්තා,කරුණා, මුදිතා, උපේක්ඛා නම් වූ සතර බඹ විහරණ - අහිංසා
4.කය වචනය දෙදොර හික්මවීමය සඤ්ඤමෝ
5.පසිඳුරන්ගේ මනා රැක්මය - දමෝ
6.රහත් මඟ නැමැති මුවින් සියලු කෙළෙස් වමාරා දැමීම - වන්තමලො

ඉහතින් දක්වන ලද කරුණු ප්‍රගුණ කරන්නා ධීරො (නුවණැත්තා) යනුවෙන් දක්වා ඇත.ඉහත ගාථා ධර්මය භික්ෂූන් උදෙසා දේශනා කළද එය ගිහි පැවිදි දෙපක්ෂයටම යොදා ගැනීමට පුළුවන. මිනිසෙක් වශයෙන් ලෝකයට ඉපදුනාට පසු නිකම්ම නිකම් හිස් ජීවිතයක් ගතකොට මිය පරලොව යෑම මිනිස්කමට නොගැලපෙන්නකි. මිනිසා යනු උසස් මනසක් ඇති සත්වයාය. දුර්ලභව ලැබූ මිනිසත් බව නම් වූ උතුම් ආත්මය තුළ ජීවත්ව සිටින්නාය. එවැන්නෙකුට කළ යුතු, නොකළ යුතු දේ මනාව අවබෝධ කොටගත හැකිය. ඔවුනට යුතුකම් හා වගකීම පිළිබඳවද අවබෝධයක් ඇත. පිං, පව් මෙලෝ, පරලෝ පිළිබඳවද තුණුරුවන් පිළිබඳ විශ්වාස කිරීමේ ඥාණ ශක්තියක් ද ඔවුන් සතුව පවතී.

එබැවින් ජලය පිරුණු කලයක් සේ, සුවඳ පිරුණු මලක් සේ, අරටුවක් ඇති ගසක් සේ ජීවිතය ලස්සන කරගැනීම උදෙසා ඉහත කරුණු ප්‍රගුණ කිරීම හා ජීවිතයට එකතු කරගැනීම කා විසිනුත් කළ යුත්තක්ව පවතී.

අපට ධර්මය තරම් වටිනා වස්තුවක් තවත් නොමැත. ධර්මය තරම් පිහිටක් ද තවත් නොමැත. ඒ අනුව ධර්මයම පහුරක් කොට ගෙන විසිය යුතුය. ධර්මය තරම් පිහිටක් ද තවත් සිතා ගැනීමටවත් නොහැකිය. අප ජීවත් විය යුත්තේ ධර්මය සමඟය. වයසට යා යුත්තේ ද ධර්මයත් සමඟය. ධර්මයට පිටුපාන්නේ නම්, ඔවුන් පිරිහීමට පත්වේ. කෙනෙක් හිස් අතින්ම වයසට යන්නේ නම් ඔවුන් තමන්ගේ ජීවිතයේ වටිනාකම සිඳ බිඳ දා ගන්නවුන් වන්නෝය. එය ඊළග භවයටද බලපාන්නකි. බුදුරදුන් දෙසූ උතුම් බුදුවදන් හදාරමින් ඒවා ප්‍රායෝගික ජීවිතය තුළ ඔප්නංවමින් දුර්ලභව ලැබූ මිනිසත්කම ගුණ ධර්ම තුළින් පිරිපුන් කරගත යුතුය. කෙටි කාලයක් ආයු විඳින සත්ත්වයා ඒ කාලය තුළ තම ජීවිතයට වටිනාකමක් දිය යුතුය. රූපය දිරාගියද නාමය සුළු කලක් හෝ පවතී. පිරිපුන් බවින් පමණක් තම නාමය දස දෙස පැතිර වීමට පුළුවන් කමක් ඇත්තේය. එබැවින් ධර්මඥානයෙන් සන්නද්ධව ගුණ ධර්ම පුරමින් පිරිපුන් කෙනෙකු ලෙස ජීවිතය ගත කිරීමට උත්සාවත් වීම අප කාටත් වැදගත් වනු ඇත.

මහව, උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය,ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රී, ගලගෙදර රතන වංශ හිමි.